The Faculty Journal of Humanities and Social Sciences, Volume 09 Issue 01, June 2020

# ශ්‍රී ලංකාවේ නියඟ ආපදා කළමනාකරණයේ දී සමාජ වැඩ මැදිහත්වීමේ අවශ්‍යතාව

# The Necessity of Social Work Intervention in Drought Management of Sri Lanka

ඉෂාරා වන්නිආරච්චි
සමාජ විද්‍යා අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර, ශ්‍රී ලංකාව.
isharawanniarachchi@gmail.com

---

**සාරසංක්ෂේපය**

තිරසර සංවර්ධන අරමුණු (Sustainable Development Goals - SDG) ළඟා කර ගැනීම සඳහා වන ගෝලීය හවුල්කාරීත්වය (Global Partnership) තුළ ලෝකයේ රටවල්වලට මුහුණ දීමට සිදු ව තිබෙන නොවැළැක්විය හැකි සංවර්ධන අභියෝගයක් වන්නේ ස්වභාවික ආපදාවන් (Natural Disasters) වර්ධනය වෙමින් පැවතීම යි. ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස ඇති ව තිබෙන මෙවැනි ස්වාභාවික ආපදාවන් මානව ශිෂ්ටාචාරයේ ආරම්භක යුගය දක්වා දිව ගිය ද, වර්තමානය වන විට ආපදා ඇති වීමේ වාර ගණන (Frequency) සහ ඒවායේ තීව්‍රතාව (Intensity) වර්ධනය වෙමින් පැවතීම සමස්ත මානව අවදානම (Human Vulnerability) වැඩි කිරීමට හේතු වී තිබේ. ශ්‍රී ලංකාවේ භූගෝලීය සීමා නිර්ණය කිරීම්වලට අනුව වැඩි ම ප්‍රමාණයක් ආවරණය කරනු ලබන වියළි කලාපය අඛණ්ඩ ව මුහුණ දෙමින් සිටින නියඟ ආපදා තත්ත්වයන් ද එම ප්‍රදේශවල ජීවත්වන්නන්ගේ යහපැවැත්මට අභියෝග කරමින් පවතින අතර සමාජ ව්‍යූහයේ පවත්නා විෂමතාවන් එම තත්ත්වය වඩාත් තීව්‍ර කර ඇති බව අනාවරණය වේ. මෙවැනි පසුබිමක් තුළ වියළි කලාපයේ අඩු ආදායම්ලාභී පවුල්වල ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට නියඟය මඟින් ඇති කර තිබෙන සමාජ - ආර්ථික බලපෑම සන්සන්දනාත්මක ව හඳුනා ගැනීමේ මුඛ්‍ය අරමුණ සහිත ව මෙහෙයවනු ලැබූ පර්යේෂණයෙන් හෙළි වූ මූලික කාරණා කිහිපයකි. ඒ අනුව, ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය (Gender) වශයෙන් ඔවුනොවුන් හිමිකර ගන්නා භූමිකාවන් සහ කාර්යයන්හි ප්‍රතිඵලයක් ලෙස අඩු ආදායම්ලාභී පවුල්වල පිරිමින්ට සාපේක්ෂ ව සමාජ ආර්ථික දෙයංශයෙන් ම කාන්තාවන් පීඩාවට පත් ව තිබූ බව හෙළි විය. සම්පත් සඳහා ප්‍රවේශ වීමට ඔවුන්ට ඇති අඩු හැකියාව මෙන් ම ආපදාවන්ට ඔරොත්තු දීම සඳහා ඇති නොහැකියාවේ ප්‍රතිඵලයක් ලෙස නියඟ ආපදාවන් මෙවැනි අඩු ආදායම්ලාභී පවුල්වල දරිද්‍රතාව චිරස්ථායී කරලීම සඳහා හේතු වී ඇති ආකාරය හඳුනාගත හැකි විය. මෙවැනි තත්ත්වයන් හුදෙක් එකී පවුල් සංස්ථාවන්ට පමණක් සිදු කරනු ලබන බලපෑමට ලඝු කළ නොහැකි හෙයින් ලෝකයේ සෑම රටක් ම පාහේ ජාතික ආපදා කළමනාකරණ (Disaster Management) ක්‍රියාවලියක් මඟින් ආපදාවන්ගෙන් මිනිසුන්ගේ ජන ජීවිතයට එල්ල විය හැකි බලපෑම අවම කරලීම සඳහා කළ හැකි කාර්යක්ෂම මෙන් ම සාකල්‍යවාදී මැදිහත්වීම් (Holistic Intervention) කෙරෙහි අවධානය යොමු කරමින් සිටියි. ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සමාජ වැඩකරුවන්ගේ මැදිහත්වීම (Social Worker’s Intervention) ලබා ගැනීම එවැනි එක් සාධනීය මැදිහත්වීමක් ලෙසින් හඳුනාගෙන තිබේ. ආපදා අවස්ථාවන්හි දී නිවැරදි තොරතුරු ලබා දෙමින් ඒවායේ අවදානම පිළිබඳ ව නිවැරදි තක්සේරුකරණය මඟින් අවබෝධයක් ලබා දීම, ආපදාවන්ට මුහුණ දීම සඳහා ප්‍රජාව තුළ ප්‍රමාණවත් සූදානමක් ඇති කිරීම, ආපදා අවස්ථාවන්හි දී කාර්යක්ෂම ක්ෂණික ප්‍රතිචාර දැක්වීම, ප්‍රජා සහභාගීත්වය වර්ධනය කිරීම සහ පශ්චාත් ආපදා අවස්ථාවන්හි දී නැවත සංවර්ධනය වැනි අංශ ඔස්සේ මානව අවදානම (Human Vulnerability) අවම කිරීම සඳහා සිදු කරනු ලබන මැදිහත්වීමේ

දී සමාජ වැඩ වෘත්තිකයාගේ කාර්යභාර්ය හා භූමිකාව විශාල පිටිවහලක් බවට පත් ව තිබෙන ආකාරය ජාත්‍යන්තර ආපදා කළමනාකරණ මැදිහත්වීම්වලින් සනිදර්ශනාත්මක ව පෙන්වා දී ඇති කරුණකි. එසේ වුව ද, තවදුරටත් ශ්‍රී ලංකාව තුළ සමාජ වැඩ ආධුනික මට්ටමක පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස ආපදා කළමණාකරන ක්‍රියාවලිය තුළ සමාජ වැඩ වෘත්තිකයාගේ භූමිකාව නිවැරදිව හඳුනාගෙන ඇති බවක් ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති සහ වැඩසටහන්වලින් පැහැදිලි ව නිරූපණය නොවන්නකි. මෙවැනි පසුබිමක් තුළ ශ්‍රී ලංකාවේ නියඟ ආපදා කළමනාකරණය කිරීම සඳහා සමාජ වැඩකරුවාගේ මැදිහත්වීමේ අවශ්‍යතාව පිළිබඳ කෙටි විමර්ශනයක යෙදීම මෙම ලිපියේ අරමුණ යි.

***මුඛ්‍ය පද*** : නියඟය, ආපදා කළමනාකරණය, මානව අවදානම, සමාජ වැඩ

## Abstract

Elevation of natural disasters is considered as an inevitable obstacle of development that countries must have to encounter in the global partnership for achieving sustainable development goals. Although these natural disasters, which occurs as a result of both natural and human activities, going back to the early period of human civilization, the entire human race is threatened by the rise of intensity and frequency of incidents at the present time. Droughts continue to afflict the dry zone, which covers the most part of Sri Lanka, and the well being of those living in the areas are being challenged while social inequality in the social structure have made it more intense. In this context, the main objective of this research was comparatively identifying the socio-economic impact of droughts on women and men in low-income families in the dry zone. Accordingly, it was revealed that as a result of gender, women suffered more than men in low-income families both social and economic sections. As a result of their low ability to access resources as well as their inability to resist disasters, drought disasters have been found as a cause to the perpetuation of poverty in such low-income families. As such circumstances cannot be limited to the family alone, almost every country in the world is focusing on effective and holistic interventions to minimize the impact of disasters on the lives of people through a national disaster management process. Meanwhile, Social workers' intervention has been identified as one of the positive interventions for planning and execution of disaster management policies. International disaster management interventions have ideally shown how the role of the social work professional has become an effective intervention to minimize the human vulnerability by providing accurate information on disasters and doing risk assessments, making adequate preparation in the community, effective response to disasters, enhancing community participation and redeveloping in post-disaster situations. Nevertheless, as a result of social work being on an apprenticeship level, it is not clearly identified the role of a social work professional in the disaster management process in Sri Lanka. In this context, the purpose of this article is to provide a brief analysis for the need of social worker intervention in drought management in Sri Lanka.

**Keywords**: Drought, Disaster Management, Human Vulnerability, Social work

## 1. හැඳින්වීම

ස්වාභාවික ආපදා යන්න මිනිසුන්ට අලුත් අද්දැකීමක් නොවන්නේ, පෘථිවිය මිනිස් වාසස්ථානයක් බවට පත් වූ දිනයේ සිට මේ දක්වා නොයෙක් ආකාරයේ ස්වාභාවික ආපදාවන්ට මුහුණ දෙමින් සිටින නිසාවෙනි. ස්වාභාවික ආපදාවක් යනුවෙන් අදහස් කරන්නේ ඔරොත්තු දීමේ නොහැකියාව ඇති පුද්ගලයන් සැලකිය යුතු සංඛ්‍යාවක් උපද්‍රවයකට ලක් වී, එයින් දැඩි හානි අත්විඳ, තම ජීවනෝපාය ක්‍රමයන්ට ද බාධා ඇති වී, බාහිර ආධාර නොමැති ව ඒවා යළි ගොඩනඟා ගත නොහැකි තත්ත්වයක් වේ (Blecky, 1994). එසේ නැතහොත් පුද්ගල ජීවිතයට හා දේපොළවලට තර්ජනයක් වනු ලබන ඕනෑම අවස්ථාවක් ආපදාවක් ලෙසින් හඳුනාගනු ලැබේ (Sri Lanka Disaster Management act, 2005). මෙවැනි ආපදා තත්ත්වයන් මිනිසුන්ගේ එදිනෙදා ජීවිතයේ කටයුතුවලට මෙන් ම, රටක දිගුකාලීන සංවර්ධන ඉලක්කයන්ට ද බාධා පමුණුවන හෙයින් ආපදා තත්ත්වයන් රටේ සංවර්ධන ක්‍රියාවලිය හා බලපෑම් කරන කොටසක් බවට පත් වනු දැකිය හැකි ය (Mary, 1994). ගංවතුර, නායයෑම්, සුළිසුළං, මුහුද ගොඩගැලීම්, භූමිකම්පා, ගිනිකඳු පිපිරීම් වැනි ආපදා තත්ත්වයන් අතර වර්තමානය වන විට ලෝකයේ සංවර්ධිත මෙන් ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල වැඩි ම ජනගහනයක් පීඩා විඳිනු ලබන ආපදා තත්ත්වයක් ලෙස නියඟ ආපදා හඳුනාගැනෙයි. කෙසේ නමුත් සංවර්ධිත රටක් නියඟයට මුහුණ දෙන වාර ගණනට වඩා විසි ගුණයක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ඉන් පීඩා විඳිනු ලබන හෙයින් (Gender and Disaster Network, 2005) සංවර්ධනය වෙමින් පවතින රටවල නියඟ ආපදා කළමනාකරණය පිළිබඳ අවධානය දැඩි කිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව තිබේ.

අනෙකුත් ආපදා තත්ත්වයන් හා සසඳා බැලීමේ දී නියඟයක ආරම්භය (Origin), ව්‍යාප්තිය (Spreading), පවත්නා කාලය (Duration) සහ නිමාව (Output) යනාදී සියල්ල ම අනපේක්ෂිත හෙයින් ඒ සඳහා නිශ්චිත අර්ථකථනයක් සැපයීම ද බෙහෙවින් ම අසීරු කාර්යයක් වී තිබේ (Saarinen, 1966)' කෙසේ නමුත් කාලගුණ විද්‍යාත්මක ව කිසියම් ප්‍රදේශයක වර්ෂාපතනය 75%කට අඩු වූ අවස්ථාවක් නියඟයක් යනුවෙන් සරල ව හඳුනාගනු ලැබේ (පෙරේරා, 2006). එමෙන් ම නියඟය පුද්ගලයන්ට නොදැනී හටගෙන සෙමින් වර්ධනය වනු ලබන හෙයින් එය "සෙමෙන් ඇති වන ආපදා" (Creeping Disaster) ගණයට අයත් වන අතර එහි විශේෂත්වය වන්නේ එය කෙනෙකුගේ අවධානයට ලක් වීම ආරම්භ වන්නේ ඉන් වන හානිය ඉහළ මට්ටමකට පත් වී ඒ වෙනුවෙන් සුවිශාල හදිසි ප්‍රතිචාර දැක්විය යුතු අවස්ථාවට පත් වීමෙන් පසුව වීම යි (Alston ) Kent, 2004). ශ්‍රී ලංකාවේ භූගෝලීය සීමා නිර්ණය කිරීම්වලට අනුව වැඩි ම ප්‍රමාණයක් ආවරණය කරනු ලබන වියළි කලාපය අඛණ්ඩ ව නියඟයෙන් පීඩා විඳිනු ලබන කලාපයක් ලෙස හඳුනාගනු ලැබේ. (තෙන්නකෝන්, 1993). ශ්‍රී ලංකාව තුළ නියඟ ඇති වීම සම්බන්ධ ව 1990 වර්ෂයේ දී පමණ තම්බයියාපිල්ලේ විසින් සිදු කරන ලද පර්යේෂණ ප්‍රතිඵලවලට අනුව දළ වශයෙන් ශ්‍රී ලංකාව වසර 20ට වරක් නියඟයේ බලපෑමට ලක්වන බැව් හෙළි වී තිබුණ ද, පසුකාලීන ව නියඟ ඇති වූ ස්වභාවයත් සමඟ එය අවුරුදු 10කට ආසන්න කාලයක් තුළ සිදු වන බැව් අනාවරණය විය (පෙරේරා, 2006). එයින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාව තුළ නියඟ ඇති වීමේ කාල සීමාව සහ එහි තීව්‍රතාව වර්ධනය වෙමින් පවත්නා ආකාරය යි. මේ නිසා

සංවර්ධනය වෙමින් පවත්නා රටක් ලෙස ශ්‍රී ලංකාව ද, නියඟ ආපදා සම්බන්ධයෙන් සුවිශේෂී අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාව මොනවට පැහැදිලි වේ.

ආපදා කළමනාකරණයේ අවශ්‍යතාව අවබෝධ කර ගනිමින් ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ සෑම රටක් ම පාහේ ජාතික මට්ටමින් ආපදා කළමනාකරණ ප්‍රතිපත්තියක් සමඟ ඒ හා අනුබද්ධිත ආයතන රැසක් ස්ථාපිත කර තිබුණ ද, එවැනි ප්‍රතිපත්ති බොහොමයක් විවිධ පූර්ව උපකල්පනයන් මත හිඳිමින් සිදු කර ඇති බවක් හඳුනාගත හැකි වේ. කිසියම් භූගෝලීය ප්‍රදේශයක් තුළ ජීවත් වන මිනිසුන්ට මුහුණ පෑමට සිදු වන ස්වාභාවික ආපදාවන් කෙරෙන් මිනිසුන්ට ඇති කරන බලපෑම එක හා සමාන මට්ටමක පවතිනු ලබන බව උපකල්පනය කරමින් මෙවැනි බොහෝ ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති සැලසුම් කර තිබෙන අවස්ථා සුලභ වේ. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවට පමණක් සීමා නොවන අතර දිගු ඉතිහාසයක සිට බොහෝ දෙනාගේ විවාදයට තුඩු දෙමින් අද දක්වා ක්‍රියාත්මක වෙමින් පවතින කරුණක් ලෙස හඳුනාගත හැකි ය. සමාජවිද්‍යාව තුළ සාකච්ඡා කෙරෙන සමාජ ස්තරායනය (Social Stratification) පුද්ගලයාගේ සමාජ තත්ත්වය, බලය, ගරුත්වය හෝ වෙනයම් සමාජ ආර්ථික සාධක පදනම් කර ගනිමින් යම් යම් කොටස්වලට නොසලකා හැරීම්, පහත් කොට සැලකීම් පැවතිය හැකි නමුත් ස්වාභාවික ආපදා යන්න සමාජ ව්‍යූහයේ (Social Structure) පවත්නා තත්ත්වයන් නොසලකා හරිමින් සියල්ලන්ට ම පොදුවේ ප්‍රජාතන්ත්‍රවාදී ව බලපෑම් එල්ල කරනු ලබන හෙයින් මෙවැනි ආපදාවන් මඟින් සමාජය තුළ කිසියම් ආකාරයක තත්ත්ව සමානකරණයක් (Status Levelers) ඇති කරනු ලබන බව බොහෝ දෙනා පෙන්වා දී ඇති කරුණකි (Fritz, 1961). කෙසේ නමුත්, මීට ප්‍රතිවිරුද්ධ අදහස් ඉදිරිපත් කරන්නන් පෙන්වා දෙනුයේ ස්වාභාවික ආපදාවන් සමාජයේ සියලු දෙනාට ම ප්‍රජාතාන්ත්‍රවාදී ස්වරූපයකින් බලපෑම් එල්ල කරනු ලැබුව ද, සමාජයේ පවත්නා යම් යම් අසමානතාවන් (Inequalities) ඒ සමඟ ඒකාබද්ධ වූ විට ආපදා මඟින් ඇති කරන බලපෑම සමාජයේ ජීවත්වන විවිධ කොටස්වලට එකිනෙකට වෙනස් වූ ආකාරයේ බලපෑම් ඇති කළ හැකි බව යි (Peacock, Killian & Bates, 1987). උදාහරණයක් ලෙස ළමයින්, තරුණයින්, වැඩිහිටියන්, කාන්තාවන්, පුරුෂයින්, විශේෂ අවශ්‍යතා සහිත වූවන් හෝ වෙනත් කායික හා මානසික ආබාධයන්ගෙන් යුක්ත මිනිසුන් සෑම සමාජයකට ම අයත් වන අතර මෙම කණ්ඩායම් එකනෙකට වෙනස් වූ ලක්ෂණයන්ගෙන් යුක්ත වේ. මේ නිසා එක ම භූගෝලීය ප්‍රදේශයක් තුළ මිනිසුන්ට මුහුණ දීමට සිදු වන ආපදා තත්ත්වයන්හි දී සමාජයේ ඇතැම් කොටස් වැඩි වශයෙන් පීඩාවට පත් වන අතරතුර තවත් කොටසක් අඩුවෙන් පීඩාවට ලක් වීමේ හැකියාවක් පවතී. මේ නිසා ස්වාභාවික ආපදා තත්ත්වයන් ද එක්තරා ආකාරයකින් සමාජ අසමානතාව හා බැඳුණු සමාජ ස්තර නිර්මාණය කිරීමට මෙන් ම පවත්නා අසමානතාවන් වඩාත් තීව්‍ර කරලීම සඳහා බලපෑම් කළ හැකි ප්‍රපංචයක් ලෙස හඳුනාගැනීම නිවැරදි වේ (Peacock et al,1987; Lynn, 2005).

විශේෂයෙන් ම සම්පත් ප්‍රවේශ වීම සඳහා ඔවුන්ට ඇති අඩු හැකියාව මෙන් ම ආපදාවන්ට ඔරොත්තු දීම සඳහා ඇති නොහැකියාව හේතු කොට ගෙන අනෙකුත් කණ්ඩායම්වලට සාපේක්ෂ ව දුගී ජන කණ්ඩායම් වැඩි වශයෙන් පීඩාවට පත් වීමේ ඉහළ සම්භාවිතාවක් පවතී (Barton,1969). එසේ වුව ද, මේ තුළ පැන නගින තවත් ගැටලුවක් වන්නේ දුගී ජන කණ්ඩායමක් තුළ ජීවත් වන සියලු ම දෙනාට ස්වාභාවික ආපදාවන් විසින් ඇති කරනු ලබන බලපෑම එක හා සමාන වන්නේ ද යන්න යි. ඒ අනුව එම ජන කණ්ඩායම තුළ ද විවිධ ප්‍රවර්ගයන් හඳුනාගත හැකි අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය (Gender) යන්න මුඛ්‍ය

සාධකයක් බවට පත් වේ. කිසිදු ස්වාභාවික ආපදාවක් ස්ත්‍රීන්ට පමණක් හෝ පුරුෂයන්ට පමණක් බලනොපාන බැව් අවිවාදාත්මක වුව ද, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වශයෙන් ඔවුනොවුන් හිමි කර ගනු ලබන තත්ත්වයන් (Status) හා භූමිකාවන්හි (Roles) ප්‍රතිඵලයක් ලෙස ඔවුනොවුන් කෙරෙහි ඇති කරනු ලබන බලපෑම වෙනස් වේ (Fothergill, 1996; Enerson, 2004; Goonasekare, 2006).

මෙවැනි පසුබිමක් තුළ, ස්වාභාවික ආපදා කළමනාකරණය සරල හෝ පහසුවෙන් කළ හැකි මැදිහත්වීමක් නොවන්නේ වඩාත් සංකීර්ණ සන්දර්භයක් තුළ අවධානය යොමු කළ යුතු අංශ ගණනාවක් ඊට අයත් ව පැවතීම යි. මේ නිසා මෙවැනි තත්ත්වයන් ස්වාභාවික ආපදා කළමනාකරණයේ න්‍යායාත්මක පැතිකඩ තුළට පමණක් සීමා නො වී ආපදා කළමනාකරණ මැදිහත්වීම් සඳහා වන ප්‍රායෝගික ප්‍රතිපත්ති හා වැඩසටහන් නිර්මාණය කිරීමේ දී යොදා ගැනීම කාලීන අවශ්‍යතාවක් බවට පත් ව තිබේ.

## 2. පර්යේෂණ අරමුණු

මෙම අධ්‍යයනය ප්‍රධාන අරමුණු තුනකින් සමන්විත විය. මෙහි එක් ප්‍රධානතම අරමුණක් වූයේ ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ අඩු ආදායම්ලාභී පවුල්වල ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට නියඟය මඟින් ඇති කරනු ලබන සමාජ - ආර්ථික බලපෑම සන්සන්දනාත්මක ව හඳුනා ගැනීම යි. පර්යේෂණයේ දෙවැනි අරමුණ බවට පත් වූයේ අඩු ආදායම්ලාභී පවුල් මුහුණ දෙන දුගීකම තව දුරටත් චිරස්ථායී කරලීම සඳහා නියඟ ආපදා කොතෙක් දුරට හේතු වී තිබේ ද යන්න හඳුනා ගැනීම යි. නියඟය වියළි කලාපයේ අඩු ආදායම්ලාභී පවුල් වෙත සිදු කරන බලපෑම අවම කරලීම සඳහා කළ හැකි සාධනීය මැදිහත්වීම් කවරේ ද යන්න හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ තෙවැනි අරමුණ බවට පත් විය. එහි දී, ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය වඩාත් කාර්යක්ෂම හා ප්‍රතිඵලදායක ආකාරයේ නියඟ කළමනාකරණයක් සඳහා කොතෙක් දුරට යොදා ගත හැකි ද යන්න විමසා බැලීම එමඟින් සිදු කරන ලදි. කෙසේ නමුත් එහි දී පැහැදිලි වන ප්‍රධාන කාරණාවක් වන්නේ නියඟය ඇතුළු ආපදා කළමනාකරණය තවදුරටත් සාම්ප්‍රදායික මැදිහත්වීම්වල දිගුවක් ලෙස මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පැවතීම යි. වර්තමානය වන විට ලෝකයේ බොහෝ රටවල් ස්වාභාවික ආපදා කළමනාකරණයේ නව උපයාමාර්ග (Strategies) හඳුනා ගනිමින් ඒවායේ සාර්ථක ප්‍රතිඵල ළඟා කර ගනිමින් සිටියි. එවැනි එක් සාර්ථක මැදිහත්වීමක් වන්නේ ස්වාභාවික ආපදා කළමනාකරණය සඳහා සමාජ වැඩකරුවන්ගේ මැදිහත්වීම වඩාත් ඒකාබද්ධ ප්‍රවේශයකින් යොදා ගෙන තිබීම යි. සමාජ වැඩ වෘත්තිය ශ්‍රී ලංකාවට තව දුරටත් ආධුනික ස්වරූපයක් ගෙන තිබුණ ද, ස්වාභාවික ආපදා කළමනාකරණය සඳහා සමාජ වැඩකරුවන් (Social Workers)ගේ මැදිහත්වීම යොදා ගත හැකි පරිසරයක් මේ වන විට අඩු වැඩි වශයෙන් නිර්මාණය වෙමින් පැවතීම ප්‍රශංසනීය වේ. මේ අනුව අධ්‍යයනයේ තුන්වැනි අරමුණ මත පදනම් වෙමින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ මිනිසුන් මුහුණ දෙමින් සිටින නියඟ ආපදා තත්ත්වයන් වඩාත් සාර්ථක ව කළමනාකරණය කිරීම සඳහා සමාජ වැඩකරුගේ මැදිහත්වීමේ අවශ්‍යතාව පිළිබඳ විශ්ලේෂණයක නිරතවීම මෙම ලිපියෙන් අපේක්ෂා කෙරේ.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

මෙම ලිපිය සඳහා පදනම් වන පර්යේෂණය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ වියළි කලාපයට අයත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ එලල්ල ග්‍රාම නිලධාරි වසම තෝරා ගත් අතර ඒ සඳහා බලපෑ ප්‍රධානතම හේතුව වූයේ අඛණ්ඩ ව නියඟයට ලක් වන දිස්ත්‍රික්ක අතර හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රමුඛ වී තිබීම මෙන් ම දුගීකමෙන් පෙළෙන වැඩි ජනගහනයක් ද එම දිස්ත්‍රික්කයට අයත් වී සිටීමත් ය. ප්‍රධාන ජීවනෝපාය ලෙස කෘෂිකර්මාන්ත කටයුතු කෙරෙහි වැඩි නැඹුරුවක් සහිත වූ මෙම අධ්‍යයන ප්‍රදේශයේ සැලකිය යුතු පිරිසක් ධීවර කටයුතුවල ද නිතර වෙති. නියඟය මඟින් අඩු ආදායම්ලාභී පවුල්වල ස්ත්‍රීන්ට ඇති කරනු ලබන බලපෑම වඩාත් නිවැරදි ව හඳුනා ගැනීම සඳහා අරමුණු සහගත නියැදීම (Purposive Sampling) ඔස්සේ අඩු ආදායම්ලාභී පවුල් තිහකට අයත් ස්ත්‍රීන් සහ පුරුෂයන් භාර්යාවන් සහ ස්වාමිපුරුෂයන් අධ්‍යයන නියැදිය ලෙස ලබා ගනිමින් සංසන්දනාත්මක අධ්‍යයනයක් (Comparative study) සිදු කරන ලදි. එහි දී, අධ්‍යයනය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස් කිරීමේ දී ගැඹුරු සම්මුඛ සාකච්ඡාවන් (Indepth Interviews) සහ නාභිගත කණ්ඩායම් සාකච්ඡාවන් (Focus Group Discussions) සිදු කරනු ලැබූ අතර ද්විතීයික දත්ත සපයා ගැනීමේ දී, ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සහ හම්බන්තොට දිස්ත්‍රික් ආපදා සහන කාර්යාලයේ වාර්ෂික වාර්තා, මේ සම්බන්ධ ව සිදු කොට ඇති දේශීය හා විදේශීය පර්යේෂණ ලිපි, සඟරා, කෘති සහ අන්තර්ජාල මූලාශ්‍රය යොදා ගනු ලැබිණි.

## 4. අධ්‍යයන සොයා ගැනීම් සහ සාකච්ඡාව

නියඟය මඟින් අඩු ආදායම්ලාභී පවුල්වල ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට ඇති කරනු ලබන බලපෑම පොදුවේ ආර්ථිකමය සහ සමාජමය බලපෑම යන ප්‍රධාන ක්ෂේත්‍ර දෙක යටතේ හඳුනාගත හැකි විය. ඒ අනුව, යථෝක්ත ආකාරයට/ඉහත සඳහන් කළ ආකාරයට මෙම ප්‍රදේශය මූලික වශයෙන් කෘෂිකර්මාන්තය මත පදනම් වන හෙයින් නියඟය මඟින් ඇති කරන ජල හිඟය (Water Scarcity) මෙම පවුල්වලට අයත් වූවන්ගේ ජීවනෝපායන් අඩාල කිරීමට ඍජු බලපෑමක් එල්ල කර තිබිණි. විශේෂයෙන් ම ජල හිඟය එම ප්‍රදේශවල කෘෂිකර්මාන්ත කටයුතුවලට ඇති කරන බලපෑමත් සමඟම පෙරට සාපේක්ෂව ඔවුන්ට ලබා ගත හැකිව තිබූ කෘෂි නිෂ්පාදනය ද අඩු වී තිබිණි. එලෙස කෘෂි නිෂ්පාදනයේ පහත බැසීම අංශ ගණනාවකින් ම මෙම පවුල්වලට නිශේධනාත්මක බලපෑම් ඇති කිරීමට හේතු වී තිබූ අතර ඉන් ප්‍රධානතම එකක් වන්නේ කෘෂි නිෂ්පාදනය අඩු වීම මඟින් ඔවුන්ට උපයා ගත හැකි ආදායම අඩු වීමත්, එය පවුලේ අවශ්‍යතා සපුරා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවීමත් ය. එහි ප්‍රතිඵලය වන්නේ මෙම පවුල් සිය පැවැත්ම උදෙසා වන අවශ්‍යතාවන් සම්පූර්ණ කර ගැනීමේ අපේක්ෂාවෙන් වෙනත් විකල්ප (Alternatives) සෙවීම්වලට යොමු වීම වන අතර ණයට ලබා ගැනීම හා වත්කම් උකස් කිරීම එවැනි විකල්ප අතර ප්‍රධාන තැනක් ගෙන තිබිණි. කෙසේ නමුත් ආපදා අවස්ථාවන්හි දී ණය ලබා ගැනීමේ දී කාන්තාවන් සහ පුරුෂයන් තුළ ඒ සඳහා තිබූ පෙළඹීම ද, එකිනෙකට වෙනස් වූ බව හෙළි විය. සම්මුඛ සාකච්ඡාවකට සම්බන්ධ වූ කාන්තාවක් සිය අදහස ප්‍රකාශ කළ ආකාරය පහත උපුටනයෙන් දැක්වේ.

"ණය තියෙද්දි ඒක ගෙවලා දානකම් ඔළුවට මහා බරක්, අඩුම තරමේ හිත නිදහසේ නිදා ගන්නවත් නැති වෙනවා. ඒක නිසා බැරිම වුණොත් ඇරෙන්න ණය ගන්නෙ නැතුව ඉන්න තරමට තමයි ඇඟට ගුණ" (සම්මුඛ සාකච්ඡා අංක 19, ක්ෂේත්‍ර අධ්‍යයනය, 2015).

මේ නිසා ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් පවත්නා අවිනිශ්චිතතාව හේතුවෙන් අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන් ආපදා අවස්ථාවන්හි දී ණය ලබා ගැනීමට ඇති පෙළඹීම ඉතා අඩු මට්ටමක පවතින බව හෙළි විය.

කෙසේ නමුත්, ණය ලබා ගැනීමට පෙළඹීමේ දී පුරුෂයන්ගෙන් සියයට අසූවකට (80%) වැඩි ප්‍රමාණයක් අවිධිමත් මාර්ග ඔස්සේ ඒවා ලබා ගෙන තිබූ අතර ස්ත්‍රීන්ගෙන් සියයට හතලිස් පහක් (45%) විධිමත් ක්‍රම ඔස්සේ ණය ලබා ගැනීම් හා උකස් කිරීම් සඳහා යොමු වී තිබුණු ආකාරයක් ද හඳුනාගත හැකි විය. නියඟ සමයන්හි දී මුහුණ දීමට සිදු වන මූල්‍යමය දුෂ්කරතාවන් මඟ හරවා ගැනීම සඳහා මෙම පවුල්වල කාන්තාවන් ණය ලබා ගැනීමට යොමු වී තිබුණේ අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන් සවිබල ගැන්වීමේ අපේක්ෂාවෙන් ශ්‍රී ලංකාවේ හම්බන්තොට සහ මොනරාගල යන දිස්ත්‍රික්කයන්හි දැනට ක්‍රියාත්මක වන ජනශක්ති බැංකු (Janashakthi Bank) සංගම් වෙතිනි. විශේෂයෙන් ම කෘෂිකාර්මික ණය ලබා නිකුත් කිරීමේ දී, නියඟ හෝ ගංවතුර වැනි ආපදාවන්ගෙන් විනාශ වීමෙන් එම ණය බොල් ණය වශයෙන් කපා හැරීම මෙවැනි අඩු ආදායම්ලාභී පවුල්වල ස්ත්‍රීන්ට විශාල අස්වැසිල්ලක් වී තිබූ අතර එම තත්ත්වය ණය ලබා ගැනීම සහ ණය ආපසු පියවා ගැනීම සම්බන්ධ ව ස්ත්‍රීන් තුළ පැවති අවදානම අඩු කර ගැනීමට ද හේතු වී තිබිණි. විශේෂයෙන් ම ආපදාවන්ට සංවේදී මූල්‍ය ආයතනයන්හි වැදගත්කම අවබෝධ කරගනිමින් ඕස්ට්‍රේලියාව වැනි රටවල නියං හානිවලට සහන රක්ෂණයක් ලෙස අවම පොලී අනුපාත සහිත බදුවලින් නිදහස් නියං බැඳුම්කර ක්‍රම හඳුන්වා දී ඇති අතර ඉන්දියාව ද මේ කෙරෙහි අවධානය යොමු කරමින් වගා කටයුතු සඳහා ණය ලබා ගෙන ඇති අවස්ථාවක දී නියං හෝ වෙනත් ස්වාභාවික ආපදා හේතුවෙන් විනාශ වුවහොත් ණය ආපසු අය කර ගැනීමේ කාල සීමාව කන්න පහකින් දීර්ඝ කොට පහසු වාරික ක්‍රමයක් යටතේ අය කර ගැනීමේ ක්‍රම දියත් කරනු ලැබේ (Dean & Stain, 2010). කෙසේ නමුත් ශ්‍රී ලංකාව තුළ තවමත් ආපදාවන්ට සංවේදී වූ මූල්‍ය ක්‍රමයක් ක්‍රියාත්මක නොවන පසුබිමක් තුළ අඩු ආදායම්ලාභී පවුල්වල ස්ත්‍රීන් ඉලක්ක කොට ගනිමින් ක්‍රියාත්මක වන ජනශක්ති බැංකු සංගම් මඟින් ඒ සඳහා කිසියම් වූ පදනමක් සපයා ඇති ආකාරයක් ද හඳුනාගත හැකි වේ. කෙසේ නමුත් ණය ලබා ගැනීම හරහා නිර්මාණය වන ණය චක්‍රය කිසියම් කාල සීමාවකට පමණක් සීමා නොවූ අතර එහි බලපෑම එම පවුල්වල දුගීකම චිරස්ථායී කරලීම සඳහා දීර්ඝකාලීන ව හේතු වී තිබිණි. කෙසේ නමුත් මෙම තත්ත්වය ද ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සබඳතාවන් මුල් කර ගනිමින් සම්පත්වල අයිතිය හා සම්පත් සඳහා ප්‍රවේශ වීමට සීමිත අවස්ථාවක් හිමි කර ගත් කාන්තාවන් නියං ආපදා සමයන්හි දී වැඩි වශයෙන් ආර්ථිකමය අතින් පීඩාවට පත් ව තිබිණි.

තව ද, මෙම අඩු ආදායම්ලාභී පවුල්වල ඉතුරුම් (Savings) පහළ මට්ටමක පැවතීම මඟින් ද අනාවරණය වූයේ නියඟ සහ පශ්චාත් නියඟ තත්ත්වයන් කළමනාකරණය සඳහා ඔවුන් තුළ ප්‍රමාණවත් පෙර සූදානමක් නොමැති බව යි. මෙම පවුල්වල ඉතුරුම් අඩු වීම සඳහා පොදුවේ බලපා තිබූ එක් ප්‍රධාන හේතුවක් මෙම අධ්‍යයනය මඟින් අනාවරණය කර ගත හැකි විය.

> "අස්වැන්න කපලා ගෙට ගන්නකොටම බඩු විකුණන මිනිස්සු ගමට එනවා. ඒ කාලෙට හැමෝටම සරුයිනෙ. ඔහොම ආපු මිනිස්සු අපේ එක්කෙනාටත් ගොයම් කපන මැෂිමක් ගන්න කියලා ඔළුවට දැම්මා. මගේ වචනෙට වඩා අර පිට මිනිස්සුන්ගේ වචනෙ ලොකු වෙලා මැෂිම ගත්තා. වාරිකෙ මාසෙට තිස්දාහක්. නොහිතූ විදියට ඊළඟ කන්නෙ නියං ඇවිත් ගොවිතැන විනාශ වුණා. අපිට අද වෙනකම් ඒ ණය ගෙවලා ඉවර කරගන්න බැරි වුණා. දැන් ගෙවන්න වෙලා තියෙන්නෙ වැල් පොලී එක්ක. අපි අන්තිම අඩියටම වැටුණා" (ගැඹුරු සම්මුඛ සාකච්ඡා අංක 11, ක්ෂේත්‍ර අධ්‍යයනය, 2015)

මේ ආකාරයට, නියඟ නොමැති කාලයන්හි, (විශේෂයෙන් ම අස්වැන්න නෙළන කාලය තුළ) වෙනත් ප්‍රදේශවල සිට භාණ්ඩ අලෙවියේ නිරත වන වෙළඳ පිරිස් මෙවැනි අඩු ආදායම්ලාභී පවුල් කරා සංක්‍රමණය වෙමින් මිළ අධික භාණ්ඩ (විශේෂයෙන් ම කෘෂිකර්මාන්තය හා සම්බන්ධ භාණ්ඩ) ගෙවීමේ ක්‍රමයට අලෙවියේ නිරත වන අතර ඒවා මිලදී ගැනීම දිගුකාලීන ව ණය උගුලක සිරවීමට හේතු වී තිබිණි. මෙම ප්‍රදේශය තුළ ඇති ව තිබෙන මෙම නව වෙළඳ සංස්කෘතියේ පවත්නා අහිතකර තත්ත්වයන් පෙන්වා දෙමින් ප්‍රජාව දැනුවත් කිරීමට එම ප්‍රදේශයේ දැනට ක්‍රියාකාරී රාජ්‍ය නොවන සංවිධාන මඟින් ද කටයුතු කර තිබූ නමුත් ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට නොහැකි වී ඇති බව හෙළි විය. විශේෂයෙන් ම මෙවැනි භාණ්ඩ මිලදී ගැනීම්වල දී එම පවුල්වල පුරුෂයන් මුල් වී තිබූ අතර ස්ත්‍රීන් ඒවායේ මිලදී ගැනීම හෝ නොගැනීම සම්බන්ධ තීරණ ගැනීම සම්බන්ධයෙන් බලපෑම් කිරීමට බලය හිමි කර ගෙන සිටියේ සියයට විස්සකටත් (20%) වඩා අඩු ප්‍රමාණයකිනි. කෙසේ නමුත් එවැනි භාණ්ඩ මිලදී ගැනීම හරහා ඇති කරනු ලබන නිශේධනාත්මක බලපෑම ඔවුන්ගේ සමස්ත පවුල් ඒකකය ම පීඩාවට පත් කිරීමට හේතු වී තිබිණි.

නියඟයේ බලපෑම වඩ වඩාත් තීව්‍ර වන අවස්ථාවන්හි දී මෙම පවුල් ඔවුන් සතු ව පවත්නා සම්පත් අලෙවි කිරීම හෝ උකස් කිරීමට පෙළඹී සිටි අතර එය පවුල තුළ ස්ත්‍රීන් සහ පුරුෂයන් සන්තක ව ඇති සම්පත් අයිතියේ ස්වරූපය මත තීරණය වී තිබිණි. ඒ අනුව මෙම පවුල්වලින් සියයට හැටකට (60%) වඩා වැඩි ප්‍රමාණයක් ස්ත්‍රීන් සතු ආභරණ අලෙවි කිරීම හෝ උකස් කිරීම සිදු කර තිබූ අතර එය එම පවුල්වල ස්ත්‍රීන්ගේ එකඟතාව සහිත ව මෙන් ම රහිත ව ද සිදු කර තිබූ බව හෙළි විය. තව ද, ස්ත්‍රීන් සහ පුරුෂයන්ගේ සහයෝගයෙන් සිදු කරනු ලබන හේන් (*Chena*) ගොවිතැන් කටයුතුවලින් ගබඩා කර ඇති අතිරික්ත නිෂ්පාදන අලෙවි කිරීම ද, මෙවැනි පවුල් විසින් සිදු කර තිබූ අතර ම එහි දී ද, ඒ සම්බන්ධ තීරණ ගැනීමේ අයිතිය එම පවුල්වලට අයත් පුරුෂයන් විසින් හිමි කර ගනු ලැබ තිබිණි. මෙම තත්ත්වය තුළ ගෘහයේ ආර්ථිකමය ස්වාධීනත්වයක් හිමි කර නොගන්නා ස්ත්‍රීන් නියඟ කාලයන්හි දී තව දුරටත් ආර්ථිකමය වශයෙන් පීඩාවට පත් වීමට හේතු වී තිබිණි.

තව ද, නියඟ කාලයන්හි ජල හිඟයෙන් කෘෂිකාර්මික කටයුතුවලට දැඩි බලපෑම් ඇති කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස නියඟවලට ලක් වන ප්‍රදේශවල මිනිසුන් විකල්ප රැකියා අවස්ථාවන් සඳහා වෙනත් ප්‍රදේශ කරා සංක්‍රමණය වෙමින් විකල්ප ආදායම් උත්පාදනයේ නිරත වන බව බොහෝ අධ්‍යනයන්ගෙන් පෙන්වා දී තිබුණ ද, (Berry, 1971; Alston & Kent 2004; Lybbert, 2013) අධ්‍යයනයට ලක් වූ මෙම අඩු ආදායම්ලාභී පවුල්වල ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට විකල්ප රැකියා අවස්ථාවන් සඳහා යොමු වීමට පැවති නැඹුරුතාව සියයට විස්සක් (20%)ක්) තරම් අවම මට්ටමක බව හෙළි විය. විශේෂයෙන් ම ස්ත්‍රීන්ට පැවරී ඇති ගෘහීය කාර්යන්ගේ (දරුවන් හෝ වැඩිහිටියන් රැක බලා ගැනීම, ආහාර හා ජලය රැස් කිරීම

වැනි කාර්යයන්) හේතු කොට ගෙන ලෙස කාන්තාවන්ට විකල්ප රැකියාවන් උදෙසා නිවසින් පිටතට සංක්‍රමණය වීමට තිබූ අවස්ථාව පුරුෂයන්ට වඩා ඉතා සීමිත වී පැවති හෙයින් නියඟ කාලයන්හි මෙම ප්‍රදේශයන්හි ස්ත්‍රී සේවා වියුක්තිය ඉහළ යාමට එය හේතු වී තිබිණි. කෙසේ නමුත් මෙය ශ්‍රී ලංකාව තුළ පමණක් හඳුනාගත හැකි පොදු තත්ත්වයක් නොවන අතර නියඟයට ලක් වන බොහෝ රටවල ස්ත්‍රීන් තුළ මෙම අවධියේ දී රැකියා වියුක්තිය වැඩි වන බව හෙළි වී තිබේ (Lybbert, 2013). කෙසේ නමුත් එලෙස ඇති වන ස්ත්‍රී සේවා වියුක්තියේ ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රීන් තමන් ජීවත් වන ප්‍රදේශය තුළින් ම නව රැකියා අවස්ථාවන් උත්පාදනය කෙරෙහි යොමු වන හෙයින් නියඟ ආපදා තත්ත්වයන් නව කාන්තා ව්‍යවසායකයන් (Women entrepreneur) බිහි වීමේ ඉහළ ප්‍රවණතාවක් ඇති කිරීමටත් එය කාන්තාවන් තුළ මූල්‍යමය ස්වාධීනත්වයක් ඇති කිරීමටත් හේතු වන බව පෙන්වා දී ඇති කරුණකි (Lybbert, 2013, Arku, 2010). කෙසේ නමුත් වියළි කලාපයේ මෙම පවුල්වලට අයත් කාන්තාවන් අතුරින් එවැනි නැඹුරුතාවක් හඳුනාගත නොහැකි වූ අතර නියඟ කාලයන්හි රැකියාවන් අහිමි වීම අඩු ආදායම්ලාභී පවුල්වල ස්ත්‍රීන් තව දුරටත් සමාජ ආර්ථික යන දෙයංශයෙන් ම වැඩි අවදානමට ලක් වීමේ වැඩි හැකියාවක් නිර්මාණය වී තිබුණි. නියඟ සමයන්හි මෙම පවුල්වලට අයත් පුරුෂයන් සියයට පහක් (5%)ක් වැනි ඉතා සීමිත සංඛ්‍යාවක් වෙනත් නගර (විශේෂයෙන් ම කොළඹ) කරා සංක්‍රමණය වී තිබුණ ද, නුපුහුණු ශ්‍රමිකයන් වීමේ ප්‍රතිඵලයක් ලෙස අඩු වැටුපකට රැකියාවල නිරතවීමට සිදු ව තිබූ හෙයින් නියඟ කාලයන්හි දී රැකියා සඳහා සංක්‍රමණය වීම සඳහා අඩු පෙළඹවීමක් ඔවුන් තුළ විය. තව ද නියඟ කාලයන්හි සිදු වන සංක්‍රමණ ද එම පවුල්වල ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට වෙනස් ස්වරූපයෙන් බලපා තිබුණු අතර පුරුෂ සංක්‍රමණ සිදු වී තිබූ බොහෝ පවුල්වල ස්ත්‍රීන්ගේ දෛනික වැඩ තොගය තව දුරටත් වැඩි කිරීමට මෙන් ම පවුලේ ආරක්ෂාව සම්බන්ධයෙන් දැඩි වගකීමකින් යුක්ත ව ක්‍රියා කිරීමට සිදුව තිබීම මෙම පවුල්වල කාන්තාවන් තවත් අතකින් පීඩාවට පත් වීමට හේතු වී තිබිණි. විශේෂයෙන් ම අධ්‍යයන ප්‍රදේශය නිරන්තරයෙන් වනඅලින්ගේ ප්‍රහාරයන්ට ලක් වන ප්‍රදේශයක් වූ හෙයින් නියඟ කාලයන්හි මෙම තත්ත්වය වඩාත් උග්‍ර තත්ත්වයකට පත්ව තිබිණි. එහි දී සංක්‍රමණය වූ පුරුෂයන් සහිත නිවෙස්වල ස්ත්‍රීන්ට වනඅලින්ගෙන් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හා දේපළ ආරක්ෂා කර ගැනීමේ ප්‍රධාන වගකීම ගෙන ක්‍රියාකරන්නට සිදු වී තිබීම තවත් පීඩාකාරී අද්දැකීම් ලැබීමට හේතු වී තිබිණි. එවැනි අද්දැකීමක් සම්මුඛ සාකච්ඡාවන් සඳහා සහභාගී වූ කාන්තාවක වෙතින් අනාවරණය විය.

> "වල්අලි ගැහැනු අයට බය නැහැ. ගිය අවුරුද්දෙ නියඟ තිබුණ දවස්වල අලි හතර දෙනෙක් අපේ ගේ ළඟටම ඇවිත් ගේ කඩලා දාන්න හැදුවා. ඒ වගේ වෙලාවට අම්මා කෙනෙකුට කරන්න පුළුවන් දෙයක් නෙමෙයි කරන්නෙ. දරුවො අඬන සද්දෙ ඇහුණම අලි ඒ ගෙවල් කඩන්නෙ නැතුව ආපහු හැරිලා යනවා. ඒක හින්ද නින්දෙ ඉන්න දරුවා කොහොමහරි අවදි කරලා අලියට ඇහෙන්න ගහලා හරි දරුවා අඬවනවා" (ගැඹුරු සම්මුඛ සාකච්ඡා අංක 14, ක්ෂේත්‍ර අධ්‍යයනය, 2015)

මෙවැනි විශ්වාස පදනම් කර ගනිමින් මෙම පවුල්වලට අයත් කාන්තාවන් විසින් ජීවිත හා දේපළ ආරක්ෂාව වෙනුවෙන් ඉහත උපක්‍රම භාවිත කරනු ලැබුව ද, දරුවන්ට අරමුණු සහගත ව පහර දීම හෝ දරුවන් කරදරයට පත් කිරීම වැනි තත්ත්වයන් හේතුවෙන් එය නැවතත් කාන්තාවන් තුළ මානසිකමය වශයෙන් පීඩාකාරී තත්ත්වයක් ඇති කිරීම සඳහා හේතු වී තිබූ ආකාරය ද අනාවරණය විය.

තව ද, ආහාර අනාරක්ෂිතතාව හෙවත් සියලු ම පුද්ගලයන්ට සෞඛ්‍ය සම්පන්න හා කාර්යශීලී දිවිපෙවෙතක් ගත කිරීම සඳහා අවදානමකින් තොරව අවශ්‍ය ප්‍රමාණවලින් හා නියමිත ගුණත්වයෙන් යුතු ආහාර ලබා ගැනීමට ඇති හැකියාවක් නොමැති වීම (රාජපක්ෂ, 1997) නියඟ කාලයන්හි මෙම පවුල්වලට මුහුණ දීමට සිදු වන තවත් එක් අභියෝගයකි. කෙසේ නමුත් නියඟයට ගොදුරු වන ලෝකයේ සෙසු රටවල් සමඟ සන්සන්දනය කිරීමේ දී ශ්‍රී ලංකාව ඇසුරින් හඳුනාගත හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ නියඟයෙන් ඇති වන ආහාර හිඟය හේතු කොට ගෙන වාර්තාගත පුද්ගල මරණ සිදු වී නොතිබීම යි (Sri Lanka Disaster Management Annual Report, 2012). එලෙස, ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමින් ආහාර සුරක්ෂිතතා තත්ත්වය සතුටුදායක මට්ටමක පැවතිය ද, ප්‍රාදේශීය මට්ටම තුළ එය එතරම් ප්‍රශංසනීය අගයක් නොගන්නා බැව් මෙමඟින් අනාවරණය විය. කෘෂි නිෂ්පාදනය අඩු වීම හා ආදායම් පහළ බැසීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම පවුල්වලට අයත් වූවන්ට නියඟ කාලයන්හි ප්‍රමාණවත් හා ගුණාත්මක ආහාර සපයා ගැනීමේ දී යම් යම් සීමාකම්වලට මුහුණ දීමට සිදු වී තිබිණි. එවැනි අද්දැකීමකට අනුව,

> "ගෙදරට හම්බ කරන මනුස්සයට කන්න දෙන එක ගෑනු අපේ යුතුකමක්. ඊටත් අපිට වගේ නෙවේ පිරිමින්ට. බඩගින්න උහුලන්න අමාරුයි. මට නම් තේ කහට එකක් බීලා වුණත් දවසම උහුලන්න පුළුවන් "(සම්මුඛ සාකච්ඡා අංක 18, ක්ෂේත්‍ර අධ්‍යයනය, 2015).

මෙලෙස නියඟ කාලයන්හි ඇති වන මෙම ආහාර අනාරක්ෂිතතාවෙන් මිදීම සඳහා පුරුෂයින්ට සාපේක්ෂ ව කාන්තාවන් වැඩි වගකීමක් සහිත ව කටයුතු කර තිබූ අතර ඒ සඳහා උපක්‍රමයක් ලෙස කාන්තාවන්ගේ මූලිකත්වයෙන් "වී (Paddy) සීට්ටු" වැනි ක්‍රම අනුගමනය කර තිබුණත්, පසුකාලීන ව ඒවා පරිහානියට ගොස් තිබිණි. කෙසේ නමුත් සමස්ත පවුල් සංඛ්‍යාවෙන් සියයට හැත්තෑවක් (70%)ක් පමණ වූ බහුතරයක් දෙනා හේන් ගොවිතැනෙන් ගබඩා කර ගත් අතිරික්තයන් පරිභෝජනය කරමින් ආහාර හිඟයට ප්‍රතිචාර දක්වා තිබුණි. නියඟ ආපදා සමයන්හි දී නිවසේ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගෙන යාම කාන්තාවකගේ වගකීමක් ලෙස කාන්තාවන් වෙතින් පිළිගෙන තිබූ ආකාරය හා සමාන ව ම මෙම පවුල්වල පුරුෂයන් ද එය කාන්තාවන් තුළ පැවතිය යුතු "අරපිරිමැසුම්දායක භාවයෙහි" ලක්ෂණයක් ලෙස හඳුනාගෙන තිබිණි. මෙම අදහස පුරුෂයෙකු විස්තර කළ ආකාරයට,

> "එක කන්නෙකින් ගෙට ගන්න වී ටික ඊළඟ කන්නෙ කපලා ගෙට ගන්නකම් පරිස්සම් කර ගන්න එක ගෙදර වියන කෙනා අතේ තමයි තියෙන්නෙ. එහෙම නැතුව කඩෙනුත් ගෙනල්ල කන්න වුණොත් ඒ ගෙවල්වල ගෑණු මූසලයි කියලනෙ කීමටත් කියන්නෙ" (සම්මුඛ සාකච්ඡා අංක 24, ක්ෂේත්‍ර අධ්‍යයනය, 2015).

ආපදා සමයන්හි දී කාන්තාවන්ගෙන් අපේක්ෂා කරනු ලබන මෙවැනි තත්ත්වයන් කළමනාකරණය කර ගැනීම සඳහා ණයට ආහාර මිලදී ගැනීම, අසල්වැසි හෝ වෙනත් ඥාතියෙකුගෙන් ආහාර හුවමාරු කර ගැනීම, ආහාර වේල් සංඛ්‍යාව අඩු කිරීම හෝ ආහාර වේලක් සඳහා ගනු ලබන ප්‍රමාණය අඩු කිරීම සහ මිල ගණන් අඩු ආහාර වර්ග මිලදී ගැනීම හා ස්වාභාවික පරිසරයෙන් රැස් කර ගත හැකි ආහාර වෙත යොමු වීම වැනි විකල්ප ක්‍රම සඳහා ද යොමු වී තිබිණි.

ආහාර අනාරක්ෂිතතාව මෙන් ම පානීය හා පරිහරණ ජල හිඟයකට මුහුණ දීමට සිදු වීම ද නියඟවලට මුහුණ පෑමට සිදු වන ඕනෑ ම ප්‍රදේශයකින් හඳුනාගත හැකි පොදු තත්ත්වයක් ලෙසින් කෙනෙකුට විග්‍රහ කළ හැකි නමුදු ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වශයෙන් හිමිකර ගන්නා

තත්ත්වයන් හා කාර්යකොටස් පදනම් කරමින්, ගෘහයේ ජලය රැස් කිරීම සම්බන්ධ වගකීම ස්ත්‍රීන් සතු ව පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස නියඟ කාලයන්හි මෙම පවුල්වල ස්ත්‍රීන් ජලය රැස්කිරීම සම්බන්ධයෙන් දැඩි පීඩාවට පත් ව තිබූ බව ද හෙළි විය. එය පහත ප්‍රකාශනයෙන් තව දුරටත් පැහැදිලි වේ.

> "නියං කිව්ව ගමන්ම මතක් වෙන්නෙ වතුර ටික තමයි. ඒ කාලෙට වෙන වැඩක් කරන්න වෙන්නෙ නැහැ. වතුර ගේනනම දවසෙන් භාගෙකටත් වඩා ඉවරයි.......... බවුසරේකින් වතුර ගෙනාවට ඒක එන වෙලාවක් කියන්නෙ නැහැ. සමහර දවසට උදේට, සමහර දවසට හවසට. ලොකුම පාඩුව වෙන්නෙ කිසිම වැඩකට ගෙදරින් පිට යන්න බැහැ, බවුසරේ කවදහරි එනකම් බලාගෙන ඉන්න වෙනවා. ගෙවල් කිට්ටුවට කුළී වැඩකට ගියොත් බවුසරේ එන ආරංචියට දුවලා ඇවිත් පුරෝගන්න පුළුවන්. ඒත් ඉතිං වැඩ ගන්න උදවිය ඒකට කැමැති නැහැනෙ, වැඩ කරන අතරතුර එහෙ මෙහෙ යනවට. අනිත් කවුරු ගෙදර හිටියත්, බවුසරේ පෙනි පෙනි ගියත් එයාලගේ පාඩුවෙ ඉන්නවා. මොකද වතුර කරදරේ දැනෙන්නෙ කුස්සියේ වැඩ කරන ගැහැනු අපිටනෙ" (සම්මුඛ සාකච්ඡා අංක 08, ක්ෂේත්‍ර අධ්‍යයනය, 2015)

නියඟ කාලයන්හි ඇති වන පානීය හා පරිහරණ ජල හිඟයට පිළියමක් වශයෙන් රාජ්‍ය මැදිහත්වීම යටතේ හම්බන්තොට ආපදා සහනසේවා කාර්යාලය ඔස්සේ මෙම ප්‍රදේශයට ජලය ලබා දීමට කටයුතු කර තිබීම මෙම ජල හිඟය අවම කර ගැනීමට හේතු වී තිබුණ ද, ජලය සැපයීම සඳහා දිනයේ නිශ්චිත වේලාවක් නොතිබීම හේතුකොට ගෙන ගෘහය තුළ දිගු වේලාවක් රැඳී සිටීමට සිදු වීම, ජලය රැස් කර ගැනීමට නොහැකි වන දිනයන්හි දී ජලය රැස් කිරීම වෙනුවෙන් විශාල දුරක් පයින් ගමන් කිරීමට සහ වැඩි කාලයක් ගත කිරීමට සිදු වීම, ජලය රැස් කර ගැනීම සඳහා ප්‍රමාණවත් බඳුන් නොමැතිවීම වැනි තත්ත්වයන් හමුවේ අඩු ආදායම්ලාභී පවුල්වල ස්ත්‍රීන්ට ජලය රැස් කර ගැනීමේ දී ගැටලු රැසකට මුහුණ දීමට වී තිබිණි. විශේෂයෙන් ම නියඟ සමයන්හි පරිහරණ ජලය ප්‍රමාණවත් පරිදි නොලැබී යාම අඩු සනීපාරක්ෂක පහසුකම් කෙරෙහි ඍජු ව ම බලපෑම් කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රදේශවල ජීවත් වන්නන් සාමාජීය වශයෙන් යම් යම් ලේබල්කරණයන්ට ද ලක්ව තිබූ බව අනාවරණය විය. එවැනි සමාජ ලේබල්කරණයන්ට ලක්ව තිබීම ද මෙම ප්‍රදේශයේ ජීවත් වීම පිළිබඳ ව මිනිසුන් තුළ අතෘප්තිකර තත්ත්වයක් ඇති කිරීමට හේතු වී තිබූ හෙයින් වෙනත් ප්‍රදේශයක ස්ථිර පදිංචියට යාමට සියයට පහළොවක (15%) පමණ පිරිසක් පූර්ණ එකඟත්වයක් පළ කරනු ලැබූ අතර මොවුන්ගෙන් බහුතරයක් ස්ත්‍රීන් වීම ද සුවිශේෂ ය.

තව ද, නියඟ සමයන්හි ඒවා කළමනාකරණය කිරීමේ අරමුණින් ජාතික මට්ටමින් සිදු කෙරෙන මැදිහත්වීම තුළ නියංසහනාධාර ලබා දීම සෑම නියඟ කාලවකවානුවක (නියංකාලවකවානුවක) ම හඳුනාගත හැකි තත්ත්වයකි. නියංසහනාධාර මෙවැනි අඩු ආදායම්ලාභී පවුල්වලට අදාළ කාල පරිච්ඡේදය තුළ මුහුණ දීමට සිදු වන ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා යම්කිසි ආකාරයක ධනාත්මක බලපෑමක් ඇති කරනු ලැබුව ද, නියංසහනාධාර ලබා දීම පිළිබඳ ව මෙම පවුල්වල ස්ත්‍රීන් සහ පුරුෂයන් ඒ කෙරෙහි දක්වා තිබුණේ එකිනෙකට වෙනස් ප්‍රතිචාරයකි. ඒ අනුව නියංසහනාධාර ලබා දීමේ ක්‍රියා පටිපාටිය තුළ අදාළ ප්‍රදේශයේ පොදු වැඩ කටයුත්තක් සඳහා කරනු ලබන ශ්‍රම සහභාගිත්වය සහනාධාර ලබා ගැනීම සඳහා වන පූර්ව අවශ්‍යතාවයක් අවශ්‍යතාවක් බවට පත්ව තිබූ අතර එවැනි කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රමය සැපයීමට වැඩි වශයෙන් ම සහභාගී වී තිබුණේ අඩු ආදායම්ලාභී පවුල්වල ස්ත්‍රීන් වීම ද විශේෂ ය. කෙසේ නමුත් ස්ත්‍රීන්ට ගෘහයේ ඇය වෙත පැවරී තිබෙන වැඩ කටයුතු (ආහාර හා ජලය රැස් කිරීම, දරුවන් හෝ වියපත් වූවන් රැක බලා ගැනීම හෝ ස්වයං රැකියාවන්හි නිරත වීම් වැනි) සිදු කරන අතරතුර

ප්‍රදේශයේ පොදු වැඩ කටයුතු සඳහා වන ශ්‍රමය සැපයීමට සිදු ව තිබීමෙන් ඔවුන් පීඩාවට පත්ව තිබූ අතර මෙම ක්‍රියාවලිය තුළ ගර්භණී කාන්තාවන්, කුඩා දරුවන් රැක බලා ගනු ලබන කාන්තාවන් සහ රෝගී කාන්තාවන් වඩාත් වැඩියෙන් අවදානමට ලක් විය හැකි කණ්ඩායම් බවට පත්ව තිබිණි.

ඔමෙන් ම, නියංසහනාධාර වශයෙන් බොහෝ අවස්ථාවන්හි රාජ්‍ය මැදිහත්වීම ඔස්සේ වියළි ආහාර ද්‍රව්‍ය බෙදා දෙනු ලැබුව ද, ඒවා මෙම පවුල්වල ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ සැබෑ අවශ්‍යතාවන් සමඟ යම්කිසි ආකාරයක නොගැළපීමක් පැවති ආකාරය ද හඳුනාගත හැකි විය. ඒ අනුව අඩු ආදායම්ලාභී පවුල්වල ස්ත්‍රීන් විසින් නියංසහනාධාර ලෙස අපේක්ෂා කරනු ලැබුවේ පිළිවෙළින් පිරිසිදු පානීය හා පරිහරණ ජලය, ආහාර, මුදල්/ණය, කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය සහ බීජ වර්ග වන අතර පුරුෂයන්ගේ අවශ්‍යතා ප්‍රමුඛතාකරණය තුළ මුදල්/ණය, කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය, බීජ වර්ග හෝ උපකරණ, පානීය ජලය සහ ආහාර වේ. මෙලෙස එකම ගෘහ ඒකකයකට අයත් වන ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ අවශ්‍යතාවන් එකිනෙකට වෙනස් ස්වරූපයක් ගැනීමට ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වශයෙන් ඔවුනොවුන් විසින් හිමි කර ගනු ලබන තත්ත්වයන් සහ කාර්ය කොටස් හේතු වී තිබෙන බැව් පෙනෙයි. උදාහරණයක් ලෙස නියංසමයන්හි දී බීමට අවශ්‍ය ජලය රැස් කිරීම කාන්තාවන් සතු කාර්යයක් බවට පත් වන හෙයින් නියංසහනාධාරවලින් ඔවුන් අපේක්ෂා කරන දෑ අතර එම අවශ්‍යතාව ප්‍රමුඛ වී පැවතිය ද, පුරුෂයින්ගේ අපේක්ෂාවන් අතර එය ප්‍රමුඛ වී නොමැති නො තිබිණි. මින් පැහැදිලි වන්නේ ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති හා වැඩසටහන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රමාණවත් පරිදි සංවේදී වෙමින් ඒවා සැලසුම් කර නොතිබීමේ ප්‍රතිඵලයක් ලෙස මෙවැනි නොගැළපීමක් ඇති ව තිබෙන බව යි. එලෙස ආපදාවන්ට මුහුණ දෙමින් සිටින ප්‍රජාවන්ගේ සැබෑ අවශ්‍යතා නිවැරදි ව හඳුනා නොගැනීමේ ප්‍රතිඵලය වන්නේ රාජ්‍ය මැදිහත්වීම යටතේ අතිවිශාල පිරිවැයක් දරමින් මෙවැනි සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කරනු ලැබුව ද, ඒවායෙන් ආපදාවට මුහුණ දී සිටින මිනිසුන්ට අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකිවී තිබීම යි.

## A. ප්‍රජා අවදානම (Community Vulnerability)


යථෝක්ත සාකච්ඡාවට අනුව, නියඟය ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ අඩු ආදායම්ලාභී පවුල්වල ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට විවිධ පැතිකඩ ඔස්සේ සිදු කරන බලපෑම හඳුනාගනු ලැබිණි. එතුළින් හෙළි වන ප්‍රධාන කාරණාව වන්නේ නියං ආපදා හේතුවෙන් අඩු ආදායම්ලාභී පවුල් පහසුවෙන් අවදානමට ලක් වීමේ වැඩි අවකාශයක් පවතින බව යි. මෙහි දී අවදානම යනුවෙන් අදහස් කරන්නේ කිසියම් ආපදා තත්ත්වයක දී මුහුණ දීමට සිදු වන තර්ජන හෝ අභියෝගකාරී තත්ත්වයන්ට සාර්ථක ව මුහුණ දීමට පුද්ගල මට්ටමින් හෝ ප්‍රජා මට්ටමින් ඇති නොහැකියාව යි. එසේත් නොමැතිනම්, ආපදා තත්ත්වයක් මඟින් ඇති කරනු ලබන කුමන ආකාරයක හෝ ඍණාත්මක බලපෑම්වලින් මිදීමට, බලපෑම අවම කරලීමට හෝ යථා තත්ත්වයට පත් කිරීමට මිනිසුන් තුළ පවත්නා හැකියාව හෝ ධාරිතාව අඩු මට්ටමක පැවතීම යි (Maripe, 2018). ඒ අනුව, මීට පෙර සාකච්ඡා කරනු ලැබූ ආකාරයට ප්‍රජාවකට අයත් ළමා, තරුණ, වැඩිහිටි, ආබාධිත, කායික මානසික අක්‍රමතාවන්ගෙන් පෙළෙන හෝ වෙනත් සමාජ, ආර්ථික හෝ සංස්කෘතික කාරණාවන් හේතුවෙන් වෙනස්කොට සැලකීමට ලක් වන සුළුතර ප්‍රජා කණ්ඩායම් මෙවැනි ආපදා තත්ත්වයන්හි දී පහසුවෙන් අවදානමට ලක් වීමේ ඉහළ අවකාශයක් හිමි කර ගනී. නියඟය, අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන්ට සහ පිරිමින්ට එක ම පවුල් ඒකකයක් තුළ වෙනස්

ස්වරූපයන්ගෙන් ඇති කර තිබූ බලපෑමෙන් මෙම තත්ත්වය වඩාත් හොඳින් ගම්‍යමාන වේ. සමස්තයක් ලෙස අවදානම පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී ආපදාමය අවස්ථාවක් තුළ ඊට මුහුණ දෙන ප්‍රජාවක් ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් ඔස්සේ අවදානමට ලක් වේ (Alexander, 2012). එනම්,

(අ) සමාජීමය අවදානම් සහගත බව (Social Vulnerability)
(ආ) ආර්ථිකමය අවදානම් සහගත බව (Economic Vulnerability)
(ඇ) භෞතිකමය අවදානම් සහගත බව (Physical Vulnerability)
(ඈ) සංස්කෘතිකමය අවදානම් සහගත බව (Cultural Vulnerability)

යනුවෙනි. මේ අනුව, නියඟය අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන්ට සහ පිරිමින්ට ඇති කරනු ලබන බලපෑම මෙම අංශ හතර ඔස්සේ හඳුනාගත හැකි ආකාරය යථෝක්ත සාකච්ඡාවෙන් පැහැදිලි වන කාරණාවකි. මෙම අවදානම් සහගත තත්ත්වයේ අවසන් ප්‍රතිඵලය වන්නේ අඩු ආදායම්ලාභී පවුල් මුහුණ දෙමින් සිටින දුගීකම තව දුරටත් චිරස්ථායී වීම යි. මේ ආකාරයට අඩු ආදායම්ලාභී පවුල්වල දුගීකම වර්ධනය කරලීම සඳහා නියඟ ආපදා බලපාන ආකාරය පහත රූපසටහනින් දක්වා ඇති 'ආපදා අවදානම් සර්පිලය' මඟින් ද පැහැදිලි කර ගත හැකි වේ.

රූප සටහන 01: නියඟය, දුගීකම සහ ආපදා අවදානම් සර්පිලය




(මූලාශ්‍රය : Ariyabandu &Wickramasinghe, 2003)

මෙමගින් පැහැදිලි කරනුයේ සමාජ ආර්ථිකමය වශයෙන් වැඩි අවදානමකට ලක් විය හැකි (ඵමකබැර්ඉකැ) දුගී කණ්ඩායම් තුළ ආපදාවන් කෙරෙහි ඔරොත්තු දීමේ හැකියාව ඉතා අවම මට්ටමක පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස නියඟ ආපදා සමයන්හි දී මෙවැනි කණ්ඩායම් තව දුරටත් පීඩාවට පත් වන ආකාරය යි. එනම් දුගීකම වර්ධනය වෙමින් පැවතීම යි. එම තත්ත්වය නියඟ සඳහා ඔරොත්තු දීමට ඇති නොහැකියාව වැඩි කිරීමත්, සම්පත් සඳහා ප්‍රවේශ වීමට ඇති අවස්ථාව සීමා වීමත් හේතු කොට ගෙන ආපදා අවදානම් සර්පිලය තවත් පුළුල් වෙමින්, වර්ධනය වෙමින් වැඩි වැඩියෙන් දුගී මිනිසුන් පීඩාවට පත් වනු දැක ගත හැකි ය වේ. මේ නිසා තව දුරටත් ආපදා කළමනාකරණය සහ දුගීකම පිටු දැකීම යන්න මාර්ග දෙකක් ඔස්සේ ගමන් කිරීමේ ජාතික මට්ටමේ උත්සාහය වෙනුවට මෙම ක්ෂේත්‍ර දෙක අතර පවත්නා සබඳතාව අවබෝධ කර ගනිමින් වඩාත් ඒකාබද්ධ ප්‍රවේශයක් යටතේ සාර්ථක හා කාර්යක්ෂම ආපදා කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ වැඩසටහන්වලින් යුක්ත මැදිහත්වීමක අවශ්‍යතාව ඇති ව තිබේ.


## B. ආපදා කළමනාකරණය සහ සමාජ වැඩ

සමාජ වෙනස්වීම (Social Change) සහ සංවර්ධනය (Development), සමාජ ඒකාබද්ධතාවය (Social Cohesion), බලගැන්වීම (Empowerment) සහ මිනිසුන්ගේ නිදහස වර්ධනය කරලීම (Liberation of people) වෙනුවෙන් පෙනී සිටින උපකාරක වෘත්තියක් (Helping Profession) ලෙස සමාජ වැඩ (Social Work Profession) හඳුනාගැනීම නිවැරදි වේ. එහි දී සමාජ සාධාරණත්වය (Social Justice), මානව අයිතිවාසිකම් (Human Rights), සාමූහික වගකීම (Collective Responsibility) සහ විවිධත්වයට ගරු කිරීම (Respect for diversities) සමාජ වැඩ වෘත්තියේ මූලික හරයන් (Core values) වනු ඇත. සමාජයේ ජීවත් වන පුද්ගල, පවුල්, කණ්ඩායම් හෝ ප්‍රජාවට මුහුණ දීමට සිදු වන අභියෝගයන් හඳුනා ගනිමින් ඒවාට සිදු කරනු ලබන නිවැරදි මැදිහත්වීම ඔස්සේ ඔවුන් තුළ යහපැවැත්ම (Wellbeing) ඇති කරලීම, පවත්වාගෙන යාම හා වර්ධනය කරලීම සමාජ වැඩ වෘත්තියේ ප්‍රධාන අරමුණ බවට පත් වේ (International Federation of Social Workers, 2020). මේ නිසා ම සමාජයේ මිනිසුන්ට හදිසි ව්‍යසන හෝ ආපදා තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වන අවස්ථාවන්හි දී, ඔවුන්ගේ ජන ජීවිත යළි නඟා සිටුවීම සඳහා කළ හැකි මැදිහත්වීම උපරිමයෙන් සිදු කිරීමේ සදාචාරාත්මක වගකීමක් සමාජ වැඩකරුවන් සතු ව පවතින බව සමාජ වැඩකරුවන්ගේ ජාතික සංගමයේ (National Association of Social Workers - NASW) ආචාර ධර්ම රාමුවෙන් (Code of Ethics) ද පෙන්වා දී ඇති කරුණකි.

මුල්කාලීන ව ආපදා කළමනාකරණ ක්‍රියාවලිය සඳහා සමාජ වැඩකරුවන්ගේ මැදිහත්වීම පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී කිසියම් හදිසි ආපදා තත්ත්වයක් හමුවේ පීඩාවට පත් වන පුද්ගල, පවුල් හා ප්‍රජා කණ්ඩායම් හෝ වෙනත් පහසුවෙන් අවදානමට ලක් විය හැකි කණ්ඩායම් (Vulnerable Groups) වෙත සේවා සපයනු ලබන වෘත්තීමය මැදිහත්වීමක් ලෙසින් හඳුනාගනු ලැබිණි (Cherry & Cherry 1996, Shahar, 1993). මේ නිසා ම ආපදා කළමනාකරණය තුළ සමාජ වැඩකරුවාගේ භූමිකාව නිරූපණය වූයේ ස්වාභාවික ආපදා තත්ත්වයන්ගෙන් මිනිසුන් ගලවා ගැනීමේ අවස්ථාව (Stage of Relief ) තුළ පමණි (Johnston, 2014). එහි දී ඇති වන හදිසි තත්ත්වයන් තුළ පුද්ගලයින්ගේ ජීවිත හා දේපළ ආරක්ෂා කර ගැනීමට කළ හැකි උපරිම දායකත්වය ලබා දෙමින් මිනිසුන්ට අවශ්‍ය සහන

සේවා ලබා දීම ඒ යටතේ සිදු කරනු ලැබිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස මුල්කාලීන ව ආපදා කළමනාකරණය තුළ සමාජ වැඩකරුගේ භූමිකාව (Role of Social Workers) න්‍යාය ගත කර ඇත්තේ ද ආපදා කළමනාකරණයේ එක් දිශානතියකට පමණක් ලඝු කරමින් බව ඇල්බට් ආර්. රොබට්ගේ ඒ. සී. ටී ආකෘතිය (Albert R. Robert's ACT Model) තුළින් අනාවරණය වන කරුණකි. කෙසේ නමුත් ආපදා කළමනාකරණය තුළ සමාජ වැඩකරුවාගේ භූමිකාව අවබෝධ කර ගැනීම සඳහා අවශ්‍ය පදනම මෙම ආකෘතිය මඟින් සපයා තිබීම වැදගත් වේ. ඒ අනුව, කිසියම් ආපදා තත්ත්වයක් තුළ ඊට ගොදුරු වන පුද්ගල, පවුල්, ප්‍රජා සහ අනෙකුත් සමාජ කණ්ඩායම් වෙත කරනු ලබන සමාජ වැඩ මැදිහත්වීම මූලික කොටස් තුනක් (03) ඔස්සේ හඳුනා ගෙන තිබේ. එය පහත රූප සටහනින් නිරූපණය කර ඇත.

රූප සටහන 02: ඇල්බට් රොබට්ගේ ACT ආකෘතිය (ACT Model)




(මූලාශ්‍රය: Johnston, 2014)

මෙම ආකෘතියට අනුව, තක්සේරුකරණය (Assessment) යන්නෙන් අදහස් කරන්නේ කිසියම් ආපදා තත්ත්වයක දී එමඟින් මිනිසුන්ට සිදු වන බලපෑම පිළිබඳ ව තක්සේරුවකට පැමිණීම යි. එවැනි තක්සේරුකිරීම් ඔස්සේ අදාළ ආපදා තත්ත්වය තුළ අවශ්‍යතා සහිත පුද්ගලයින් නිවැරදි ව හඳුනාගැනීමේ හැකියාව පවතින අතර ඒ ඔස්සේ ඔවුන්ගේ අවශ්‍යතා සඳහා ක්ෂණික ප්‍රතිචාර දැක්වීමට සමාජ වැඩකරුවන්ගේ මැදිහත්වීම සිදු කළ හැකි ආකාරය හඳුනාගනු ලැබිණි. උදාහරණයක් ලෙස ගංවතුර, නායයෑම් හෝ භූමිකම්පා වැනි හදිසියේ ඇති වන ස්වාභාවික ආපදා තත්ත්වයන්හි දී මිනිසුන්ගේ නිවාස අහිමි හෝ වෙනත් දේපළ අහිමි වී තිබේ නම් ක්ෂණික ව මිනිසුන් වෙනත් තාවකාලික රැඳවුම් මධ්‍යස්ථානයක් කරා යොමු කරවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනුයේ මෙවැනි තක්සේරුකරණයන් වෙතින් ලබා ගනු ලබන තොරතුරු මත පදනම් වෙමිනි. රොබට්ගේ ආකෘතිය අනුව සමාජවැඩකරුවන් විසින් මෙම මැදිහත්වීම කිසියම් ආපදා තත්ත්වකයට මුහුණ දෙමින් සිටිනු ලබන අවස්ථාවේ දී සිදු කරන්නකි.

දෙවැනි අංශය වූ ව්‍යසන සඳහා මැදිහත්වීම (Crisis Intervention) තුළ සමාජ වැඩකරුවන්ගේ භූමිකාව වඩාත් පුළුල් වූ සන්දර්භයක් තුළ හඳුනාගෙන ඇති බවක්

පෙනෙයි. ඒ අනුව, ඇතිව තිබෙන ආපදා තත්ත්වයේ බලපෑම අවම කරලීම සඳහා අවශ්‍ය මැදිහත්වීම මෙහි දී සිදු කරනු ලැබේ. එහිදී මිනිසුන් මුහුණ දෙමින් සිටින ආපදා තත්ත්වය තුළ ඉතා බරපතල / සංකීර්ණ අවස්ථාවන් හඳුනා ගැනීම (Identify Critical Incidents), ඉන් මිනිසුන් මුදවා ගැනීම සඳහා සුදුසු විකල්ප සොයා බැලීම (Explore Appropriate Alternatives), ඒවා ක්‍රියාත්මක කළ හැකි ආකාරයේ ක්‍රියා සැලැස්මක් දක්වා සංවර්ධනය කිරීම (Develop Action Plan) සහ පසුවිපරම (Follow - up) සමාජ වැඩකරුගේ භූමිකාවට අයත් විය.


මෙම ආකෘතියේ අවසන් අංශය වී තිබෙන ප්‍රතිකාරය (Treatment) තුළ පශ්චාත් ආපදා තත්ත්වය කෙරෙහි අවධානය යොමු කර ඇති නමුදු එය ආපදාවට ලක් වූවන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ ව වැඩි නැඹුරුතාවකින් යුක්ත ව ඉදිරිපත් කර ඇති බව පැහැදිලි ව පෙනෙන කරුණකි. එහෙයින් ආපදා තත්ත්වයකින් පසුව ඇති විය හැකි පශ්චාත් ව්‍යසන ආතති ආබාධයන් (Post Traumatic Stress Disorder - PTSD) ඇතුළු වෙනත් සෞඛ්‍යමය වශයෙන් ඇතිවන බිඳවැටීම්වලින් මිනිසුන් මුදවා ගනිමින් යහපත් සෞඛ්‍ය තත්ත්වයක් ඇති කිරීම සඳහා අවශ්‍ය ව්‍යසන ප්‍රතිකාර සැලැස්මක් (Trauma Treatment Plan) සමාජ වැඩකරුගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කළ හැකි බව පෙන්වා දී තිබේ.

කෙසේ නමුත් ආපදා තත්ත්වයක දී සමාජ වැඩකරුගේ භූමිකාව නිරූපණය කරමින් ඇල්බට් රොබට් විසින් ඉදිරිපත් කරනු ලැබූ මෙම ආකෘතිය තුළ ගැටලු ගණනාවක් පසුකාලීන ව හඳුනා ගන්නා ලදි. ඉන් ප්‍රධානතම එකක් වූයේ යථෝක්ත ආකාරයට මෙම ආකෘතිය ආපදා කළමනාකරණයේ එක් අංශයකට පමණක් නැඹුරු වෙමින් ආකෘතිගත කර තිබීමෙන් ආපදා කළමනාකරණයේ දී සමාජ වැඩකරුගේ භූමිකාව සෙසු අංශ කෙරෙන් ගිලිහී ගොස් තිබීම යි. ඒ අනුව, මෙම ආකෘතිය තුළ වැඩි වශයෙන් අවධානය යොමු කර ඇත්තේ කිසියම් ආපදා තත්ත්වයකට මුහුණ දෙමින් සිටින අවධිය තුළ සමාජ වැඩකරුවන්ගේ මැදිහත්වීමේ ස්වරූපයන් පිළිබඳ ව ය. කෙසේ නමුත් එය ආපදා කළමනාකරණය තුළ සමාජ වැඩකරුගේ භූමිකාව යම්කිසි ආකාරයක ලඝු කිරීමක් මෙම ආකෘතියෙන් සිදු ව තිබෙන බව බොහෝ විචේචකයින් පෙන්වා දෙනු ලබන කරුණකි. තව ද, ආපදා තත්ත්වයක් මිනිසුන් කෙරෙහි ඇති කරන බලපෑම කිසියම් කාල සීමාවකින් පසුව අවසන් වන්නේ යැයි පූර්ව උපකල්පන ඉදිරිපත් කළ නොහැකි හෙයින් පශ්චාත් ආපදා කාලසීමාව කෙරෙහි අවධානය යොමු කිරීම ද වැදගත් වේ. කෙසේ නමුත් රොබට් ඉදිරිපත් කර ඇති ආකෘතිය තුළ එවැනි තත්ත්වයන් පිළිබඳ ව ප්‍රමාණවත් සලකා බැලීමක් සිදු කර නොමැති බව ද පෙන්වා දී ඇති කරුණකි. යථෝක්ත ආකාරයට, රොබට්ගේ ACT ආකෘතිය තුළ ප්‍රතිකාරය (Treatment) යන මූලධර්මය තුළින් පශ්චාත් ආපදා තත්ත්වයන්හි දී සමාජ වැඩකරුවන්ගේ මැදිහත්වීම හඳුනාගෙන තිබුණ ද, ප්‍රතිකාරය තුළ ඔහු වැඩි වශයෙන් ආපදාවලට ගොදුරු වන්නන්ගේ මානසික සෞඛ්‍යමය පැතිකඩ කෙරෙහි පමණක් අවධානය යොමු කර තිබීම නිවැරදි නොවන බව විචේකයින්ගේ අදහස යි. එමගින් මානසික සෞඛ්‍ය වෘත්තිකයන්ගේ සහ සමාජ වැඩකරුවන්ගේ භූමිකාවන් අතර යම්කිසි ආකාරයක වෘත්තිමය ඝට්ටනයක් ඇති වන හෙයින් ඒවා පිළිබඳ ව පැහැදිලි අර්ථකථනයක් ලබා දී නොතිබීම ද තවත් ගැටලු සහගත තත්ත්වයක් ලෙසින් හඳුනාගනී. තව ද පශ්චාත් ආපදා තත්ත්වය පුද්ගල මානසික සෞඛ්‍ය කෙරෙහි පමණක් ලඝු කළ නොහැකි අතර ඉදිරි අනාගතය තුළ මෙවැනි ස්වාභාවික ආපදා තත්ත්වයන් ඇති නොවීමට හෝ අවම කර ගැනීමට හා ඒවායින් ඇති විය හැකි බලපෑම අවම කරලීම සඳහා වන සැලසුම් සහගත පූර්ව සූදානමක් අවශ්‍ය වුව ද, එවැනි

අංශ කෙරෙහි මෙම ආකෘතිය මගින් අවධානය යොමු නොකිරීම ආකෘතියෙන් මගහැරී ගිය තවත් අවස්ථාවන් (Missing links) ලෙස හඳුනාගනු ලැබේ.

රොබට් විසින් ඉදිරිපත් කරනු ලැබූ මෙම ආකෘතියේ එවැනි පොදු දුර්වලතාවන් කිහිපයක් හඳුනාගනු ලැබුව ද, ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබූ මෙම ආකෘතිය මත පදනම් වෙමින් ආපදා කළමනාකරණය තුළ සමාජ වැඩකරුගේ මැදිහත්වීම වඩාත් පුළුල් සන්දර්භයක් තුළ ප්‍රතිනිර්වචනය කරමින් පසුකාලීන ව සංවර්ධනය කරනු ලැබිණි (Dodds & Nuehring,1996; Johnston, 2014). ඒ අනුව, ආපදා කළමනාකරණ ක්‍රියාවලියට අයත් ආපදා චක්‍රයේ (Disaster Cycle) සියලු ම අවස්ථාවන් තුළ සමාජ වැඩකරුවන්ගේ මැදිහත්වීමේ අවශ්‍යතාව හඳුනා ගන්නා ලදි. එය පහත රූප සටහනින් නිරූපණය කර ඇත.

රූප සටහන අංක 03: ආපදා චක්‍රයේ විවිධ අවස්ථා සඳහා සමාජ වැඩකරුගේ භූමිකාව




මෙහි දී, ආපදා කළමනාකරණය සඳහා සමාජ වැඩකරුගේ මැදිහත්වීම ආපදා චක්‍රයේ සෑම අවස්ථාවක් හා සම්බන්ධ වන හෙයින් යථෝක්ත සාකච්ඡාවට අනුව රොබට්ගේ ACT ආකෘතියට වඩා සමාජ වැඩකරුවන්ගේ භූමිකාව වඩාත් පුළුල් වපසරියක් තුළ හඳුනාගත හැකි වේ. ඒ අනුව, ස්වාභාවික ආපදාවන් අතර යථෝක්ත අධ්‍යයනය සඳහා පදනම් වූ නියඟ ආපදා තත්ත්වයන්හි දී ඒවා කළමනාකරණය සඳහා සමාජ වැඩකරුවන්ගේ මැදිහත්වීමේ අවශ්‍යතාව සහ එම මැදිහත්වීම සිදු කළ හැකි ආකාරය පිළිබඳ විමසා බැලීම මෙතැන් සිට විමසා බලමු.

ඒ අනුව, නියඟ කළමනාකරණය සඳහා සමාජ වැඩකරුගේ මැදිහත්වීම යථෝක්ත සාකච්ඡාවට අනුව ආපදා චක්‍රය ඇසුරින් හඳුනාගත හැකි වේ. ඒ අනුව, නියංආපදා චක්‍රයට අයත්,

(01) නියඟයට පෙර සූදානම් වන අවස්ථාව
(02) නියඟයට මුහුණ දෙන අවස්ථාව (බලපෑමට ලක් වන අවස්ථාව)
(03) නියඟයක ප්‍රතිසාධන අවස්ථාව
(04) නියඟයකින් පසු නැවත සංවර්ධනය වීමේ අවස්ථාව

යනුවෙනි. මෙම සෑම අවස්ථාවක් සඳහා සිදු කරනු ලබන සමාජ වැඩකරුගේ මැදිහත්වීම වඩාත් වැදගත් වන්නේ කිසියම් සමාජ ව්‍යුහයක් තුළ පවත්නා විවිධත්වයන් සහ විෂමතාවන් අවබෝධ කර ගනිමින් එම මැදිහත්වීම සිදු කිරීමේ ශක්‍යතාව ඔවුන් සතු වන බැවිනි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභී පවුල්වලට මුහුණ දීමට සිදුවන නිය ආපදා කළමනාකරණයේ දී සමාජ වැඩකරුවන්ගේ මැදිහත්වීමේ ස්වරූපය සහ අවශ්‍යතාව මෙතැන් සිට සාකච්ඡා කරමු.

## C. නියඟයට පෙර සූදානම් වන අවස්ථාව

ගාඳුරු වෙමින් පැවතිය ද, නියඟය හදිසි ප්‍රතිචාර දක්විය යුතු ක්ෂණික ව ඇති වන ආපදා තත්ත්වයක් නොවීමේ ප්‍රතිඵලයක් ලෙස නියං කළමනාකරණය සඳහා කරනු ලබන මැදිහත්වීම් ද ප්‍රමාණවත් නොවන බව පැහැදිලි වන කරුණකි. කෙසේ නමුත් මෙහි ඇති වඩාත් බරපතල තත්ත්වය වන්නේ ක්ෂණික ව ඇති වන ආපදා තත්ත්වයන්ට වඩා දිගු කාලයක් තුළ වර්ධනය වන නියඟයෙන් ඇති කරනු ලබන බලපෑම ඉතා ඉහළ මට්ටමක පැවතීම යි. නියං ආපදා තත්ත්වයන්ට මුහුණ දෙමින් සිටින ලෝකයේ බොහෝ සංවර්ධිත රටවල් මෙම තත්ත්වය අවබෝධ කර ගනිමින් නියං ආපදාවන්ගෙන් මිනිසුන්ට ඇති කරනු ලබන බලපෑම අවම කරලීම සඳහා ඒ වෙනුවෙන් පූර්ව සූදානමක් ඇති ව කටයුතු කරනු දැකිය හැකි වේ. එම සූදානම නියඟයට ලක් වන ප්‍රදේශවල ජනතාව තුළ මෙන් ම ඒ රටවල රාජ්‍ය ප්‍රතිපත්තිමය මට්ටමෙන් ද හඳුනාගත හැකි තත්ත්වයකි. උදාහරණයක් ලෙස නියං ආපදා තත්ත්වයන්ට ගොදුරු වීමේ තීව්‍රතාව වැඩි වෙමින් පවත්නා ඕස්ට්‍රේලියාව සිය ආපදා කළමනාකරණ ක්‍රියාවලිය තුළ නියං ආපදා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇති අතර පවත්නා තාක්ෂණය යොදා ගනිමින් නියඟ ඇති වීමේ රටාව අධ්‍යයනය කරමින් අනාගතයෙහි නියඟ ඇති විය හැකි සම්භාවිතාව හා කාලසීමාව ප්‍රක්ෂේපණය කරනු ලබයි. පසුව එම ප්‍රක්ෂේපිත කාල සීමාව පිළිබඳ ව නියඟවලට ගොදුරු වන ප්‍රදේශවල ජනතාව දැනුවත් කිරීම සිදු කරන අතර එම කාලය තුළ නියඟයෙන් ඇති වන බලපෑම අවම කර ගැනීම සඳහා කළ යුතු දේ පිළිබඳ ව ජනතාව තුළ අවබෝධයක් ඇති කරන අතරතුර අදාළ කාලසීමාව තුළ රාජ්‍ය මැදිහත්වීම කෙබඳු ආකාරයෙන් විය යුතු ද යන්න පිළිබඳ ව පූර්ව සැලැස්මක් ඔවුන් තුළ පවතියි (Hanigan, Butler & Kokic, 2012). මෙම සූදානම නියං ආපදාවන්ට මුහුණ දීමට සිදු වන කාලය තුළ ඇති කරන බලපෑම අවම කරලීම සඳහා සෘජු ව ම හේතු වී තිබීම ඔවුන්ගේ ආපදා කළමනාකරණ ප්‍රතිපත්තියේ පවත්නා සුවිශේෂීතාව යි.

කෙසේ නමුත් ඉහත තත්ත්වය හා සන්සන්දනය කිරීමේ දී ශ්‍රී ලංකාව තව දුරටත් නියඟවලට ගොදුරු වන ප්‍රදේශවල මිනිසුන් මෙන් ම රාජ්‍ය මැදිහත්වීම තුළ ද නියං ආපදා සඳහා ප්‍රමාණවත් පූර්ව සූදානමක් ඇති බවක් නො පෙනේ. මෙවැනි පසුබිමක් තුළ ඒ සඳහා පූර්ව සූදානමක් මිනිසුන් තුළ ඇති කරලීම කාලීන අවශ්‍යතාවක් බවට පත් වේ. කෙසේ නමුත්, මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූ පරිදි ජාතික මට්ටමින් පිළිගැනීමක් නොලැබී තිබෙන දේශීය දැනුම් (Indigenous Knowledge) සම්භාරයක් මත පදනම් වෙමින් මෙම ප්‍රදේශවල

ජීවත් වන්නන් නියඟය සම්බන්ධ විවිධ පුරෝකථනයන් සිදු කිරීමට සමත් ව සිටින ආකාරය යථෝක්ත අධ්‍යයනය මඟින් ද හෙළි විය. විශේෂයෙන් ම වියළි කලාපයට ආවේණික විවිධ ශාකයන්හි මල් හට ගැනීම හා සත්ත්ව චර්යාවන් ඇතුළු ස්වාභාවික පාරිසරික නිරීක්ෂණයන් මත පදනම් වෙමින් නියඟය පිළිබඳ ව යම් පූර්ව දැනුවත්භාවයක් ඔවුන් ලබා ගෙන තිබිණි. කෙසේ නමුත් විද්‍යාත්මක පදනමකින් තොර ව ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ දෙනාගෙන් මෙවැනි කාරණා ගිලිහී ගොස් තිබුණ ද, සමාජ වැඩකරුගේ මැදිහත්වීම තුළ හඳුනාගත හැකි එක් සුවිශේෂී කාරණාවක් වන්නේ ප්‍රජාවගේ දේශීය ඥානය කෙරෙහි ගරු කරමින් සමාජ වැඩ මැදිහත්වීම් සඳහා ගැළපෙන ආකාරයෙන් යොදා ගැනීම යි. එම තත්ත්වය තුළ ද ස්ත්‍රී පුරුෂභාවීය වශයෙන් ඔවුනොවුන් හිමි කර ගන්නා දැනුමේ සුවිශේෂීතාවන්ට වඩාත් සංවේදී වෙමින් නියං ආපදාවලට මුහුණ දීමේ පූර්ව සූදානම ඇති කිරීමට කටයුතු කිරීම වැදගත් වේ. දේශීය දැනුමට අවස්ථාවක් ලබා දෙන අතරතුර ආපදා ප්‍රක්ෂේපණය කිරීමේ නවීන තාක්ෂණය හා දැනුම ලබා ගැනීමේ අවස්ථා ඇති කරලීම ද රාජ්‍ය මට්ටමින් සිදු විය යුතු එක් සාර්ථක මැදිහත්වීමකි.

ඕනෑ ම ආපදා අවස්ථාවකට පූර්ව සූදානමක් ඇති කර ගැනීමේ දී වඩාත් වැදගත් වන සාධකයක් වන්නේ ආපදාවට ලක් වීමෙන් පසුව ඔවුන්ට මුහුණ දීමට සිදු වන අභියෝගකාරී අවස්ථාවන් හඳුනා ගැනීම හෝ පූර්ව ආපදා අවස්ථාවන් වෙතින් ලබා ඇත අද්දැකීම් පදනම් කර ගනිමින් ආපදාවේ සැබෑ ස්වරූපය හා බලපෑම හඳුනා ගැනීම යි. ඒ අනුව, පූර්ව සූදානම තුළ කළ යුත්තේ හඳුනාගත් එවැනි තත්ත්වයන් ඇති වීම වළක්වාලීම හෝ ඉන් ඇති වන බලපෑම අවම වන ආකාරයේ මැදිහත්වීමකි (Banerjee & Gillespie, 1994). විශේෂයෙන් ම නියඟයට ගොදුරු වන අඩු ආදායම්ලාභී පවුල් නියං කාලසීමාව තුළ මුහුණ දෙන මුදල් හිඟකම, ආහාර අනාරක්ෂිතතාව වැනි තත්ත්වයන්ගෙන් ඇති විය හැකි බලපෑම අවම කර ගැනීම සඳහා යම්කිසි පූර්ව සූදානමක් ඇති කිරීම වැදගත් වේ. නිදසුනක් ලෙස මෙම ප්‍රදේශවල පැවති ආහාර සීට්ටු ක්‍රම ඔවුන්ගේ ආහාර සුරක්ෂිතතාව කෙරෙහි බලපා තිබූ නමුත් මේ වන විට එවැනි සාම්ප්‍රදායික ක්‍රම පරිහානියට පත්ව ගොස් තිබෙන ආකාරයක් දැක ගත හැකි වේ. කෙසේ නමුත් එය මිනිසුන් විසින් සාම්ප්‍රදායික ව පවත්වාගෙන ආ නියං කාලවලට ඔරොත්තු දිය හැකි ආකාරයේ එක් සාර්ථක උපක්‍රමයක් ලෙසින් හඳුනාගත හැකි වේ. මීට අමතර ව, අඩු ආදායම්ලාභී පවුල් නියං කාලයන්හි මුහුණ දෙන ආර්ථිකමය ගැටලු අවම කරලීම සඳහා ඔවුන් තුළ ඉතුරුම් සංස්කෘතියක් ඇති කිරීම වැනි තත්ත්වයන් ද වඩාත් ඵලදායී වේ. මෙහි දී ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය වශයෙන් ඔවුනොවුන් හිමි කර ගන්නා තත්ත්වයන් සහ කාර්යකොටස් පදනම් කර ගනිමින් එම පූර්ව සූදානම ඇති කිරීමට කටයුතු කිරීම වැදගත් වේ. මෙලෙස ඒ ඒ කණ්ඩායම් තුළ පවත්නා දැනුම (Knowledge) සහ භාවිතාවන් (Practices) කෙරෙහි අවධානය යොමු කරමින් ඔවුන් තුළ පූර්ව සූදානමක් ඇති කිරීමේ දී ප්‍රජාවට අවශ්‍ය මඟපෙන්වීම සමාජ වැඩකරුගේ මැදිහත්වීම යටතේ සිදු කළ හැකි වේ. එහි දී ප්‍රජා සහභාගිත්වය (Community participation) සහ ප්‍රජා බලගැන්වීම (Community Empowernment) වැනි ක්‍රම ඔස්සේ එම පූර්ව සූදානම ඇති කිරීමේ දැනුම හා හැකියාව සමාජ වැඩකරුවන් හිමිකර ගනු ඇත.

### D. නියඟයට මුහුණ දෙන අවස්ථාව (බලපෑමට ලක් වන අවස්ථාව)


ආපදා චක්‍රයේ දෙවැනි අවස්ථාව වන්නේ ඊට මුහුණ දෙන අවස්ථාව නැතහොත් බලපෑමට ලක් වන අවස්ථාව යි. මෙම අවස්ථාවේ ඇති සුවිශේෂීතාව වන්නේ අදාළ ආපදා තත්ත්වයේ උපරිම බලපෑමට ලක් වෙමින් මිනිසුන්ගේ ජීවිත හෝ දේපළ හානිවල අද්දැකීම්වලට මුහුණ

දීමට ආපදාවට ගොදුරු වූවන්ට සිදු වීම යි. මේ නිසා ම ආපදා කළමනාකරණ ක්‍රියාවලිය තුළ සැලසුම් කරනු ලබන බොහෝ ප්‍රතිපත්ති සහ වැඩසටහන් ද මෙම අවස්ථාව කෙරෙහි වැඩි නැඹුරුවක් සහිත ව සැලසුම් කර ඇති බවක් ද හඳුනාගත හැකි වේ. නියඟ ආපදාවන් සමඟ මෙය ගැළපීමේ දී නියඟයේ උපරිම බලපෑමට ලක් වන අවස්ථාව මීට අයත් වේ. මෙම අවස්ථාව කළමනාකරණය කර ගනිමින් අදාළ කාලසීමාව තුළ මිනිසුන්ට විය හැකි බලපෑම අවම කරලීම සඳහා රොබට්ගේ ACT ආකෘතියේ සඳහන් තක්සේරුකරණය (Assessment), ව්‍යසන මැදිහත්වීම (Crisis Intervention) සහ ප්‍රතිකාරය (Treatment) යන මූලධර්ම ත්‍රිත්වය ඔස්සේ සමාජ වැඩකරුගේ මැදිහත්වීම හඳුනාගත හැකි වේ.

ඒ අනුව, ආපදාවන්ගෙන් මිනිසුන්ට සිදුව ඇති බලපෑම පිළිබඳ ව කෙරෙන තක්සේරුකරණයන් ඔස්සේ සමාජ වැඩකරුට මෙම අවස්ථාව තුළ මූලාරම්භකයෙක් (Initiator) මෙන් ම පර්යේෂකයෙක් (Researcher) ලෙස කටයුතු කිරීමේ හැකියාවක් පවතී. නියඟයේ උපරිම බලපෑමට ලක් වන මෙම අවධිය තුළ එම ප්‍රදේශවල ජීවත්වන්නන්ගේ දේපළ හා ජීවිතවලට ඇති ව තිබෙන බලපෑම තක්සේරු කිරීම මෙහි දී ඉතා වැදගත් වේ. නායයෑම්, සුළිසුළඟ, ගංවතුර වැනි හදිසි ආපදා තත්ත්වයන් හමුවේ රාජ්‍ය මැදිහත්වීම හරහා යම් යම් තක්සේරුකරණයන් සිදු කළ ද, නියං ආපදාවන්හි ස්වරූපය අනුව එවැනි විධිමත් මෙන් ම ප්‍රමාණවත් තක්සේරුවක් මේ වන විටත් නියඟයට ලක් වන ප්‍රදේශවල ක්‍රියාත්මක නො වේ. නියඟ කළමනාකරණය බොහෝ විට ජලය බෙදා දීම හා නියං සහනාධාර බෙදා හැරීමේ ක්‍රියාවලියකට සීමා වීමෙන් පැහැදිලි වන්නේ ද මෙවැනි තක්සේරුකරණයන්ගේ අවශ්‍යතාව යි. මේ නිසා නියඟයට ගොදුරු වන ප්‍රදේශයන්හි මිනිසුන්ට එමඟින් ඇති කර තිබෙන බලපෑම පිළිබඳ ව සිදු කරන තක්සේරුකරණයන් ඔස්සේ අදාළ අවස්ථාව තුළ ඔවුන්ගේ ක්ෂණික අවශ්‍යතා (Immediate Needs) මොනවා ද යන්න හඳුනාගනිමින් ඒවාට ක්ෂණික ප්‍රතිචාර දැක්වීම (Immediate Response) එම බලපෑමෙන් ඔවුන් මුදවා ගැනීමේ කාර්යය ද වඩාත් පහසු කරලීමට හේතු වේ. විශේෂයෙන් ම මෙවැනි තක්සේරුකරණයන් ඔස්සේ මෙම අවස්ථාවේ දී අවශ්‍යතා සහිත පුද්ගලයින් හඳුනා ගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා අවශ්‍ය සම්පත් වෙත ප්‍රවේශ කරලීම සඳහා පුද්ගලයින් යොමු කරවීමේ කාර්ය සමාජ වැඩකරුගේ මඟපෙන්වීම යටතේ සිදු කළ හැකි වේ.

මෙම අවධිය තුළ සමාජ සමාජ වැඩකරුගේ මැදිහත්වීම මට්ටම් කිහිපයක් යටතේ හඳුනා ගත හැකි වේ. එනම්, ක්ෂුද්‍ර මට්ටම (Micro Level), මධ්‍යම (Mezzo Level) සහ සාර්ව මට්ටම (Macro Level) යනුවෙනි. පහත රූප සටහනින් එය තව දුරටත් පැහැදිලි කර ගත හැකි වේ.

රූප සටහන අංක 04: නියඟ කළමනාකරණය සඳහා වන තක්සේරුකරණයේ දී සමාජ වෘත්තිවේදියාගේ මැදිහත්වීමේ විවිධ මට්ටම්




මේ අනුව, නියං ආපදාවන් සම්බන්ධ තක්සේරුකරණයන් සිදු කිරීමේ දී සමාජයේ විවිධ අංශ පිළිබඳ ව අවබෝධයක් සහිත ව ඒ සියලු ම දෙනා අන්තර්ගත වන ආකාරයට විවිධ මට්ටම් ඔස්සේ සිදු කරනු ලබන තක්සේරුකරණයන් ඔස්සේ තොරතුරු ද ලබා ගැනීමෙන් මිනිසුන් මුහුණ දෙමින් සිටින සැබෑ අවශ්‍යතාව මෙන් ම ඔවුන්ගේ සැබෑ අවශ්‍යතාවන් හඳුනා ගැනීම ද කළ හැකි වේ. එකම පවුල් ඒකකයක් තුළ වුව ද, ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය වශයෙන් පවත්නා වෙනස්කම් පදනම් කොට ගනිමින් නියඟයෙන් ඇති කරනු ලබන

බලපෑම එකිනෙකට වෙනස් වූ ආකාරය යථෝක්ත අධ්‍යයනයෙන් ද අනාවරණය විය. මෙවැනි තත්ත්වයන් මත සංවේදී වෙමින් අවශ්‍යතා සහිත පුද්ගලයින් (Needy victims) හා ඔවුන්ගේ සැබෑ අවශ්‍යතා හඳුනා ගැනීමත්, ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සේවා සැපයීම සඳහා වෙනත් සහන සේවා කණ්ඩායම් හෝ ස්වේච්ඡා කණ්ඩායම් එවැනි මිනිසුන් වෙත සම්බන්ධ කිරීමට කටයුතු කරන සමාජ වැඩකරු මෙහි දී සම්බන්ධීකාරකවරයකුගේ (Coodinator), කණ්ඩායම් පහසුකාරකයකුගේ (Group Facilitator) මෙන් ම අවස්ථානුකූල ව තැරැව්කරුවෙකු (Broker)ගේ භූමිකාවෙහි ද නිරත වෙයි. තව ද, ඇති ව තිබෙන අයහපත් තත්ත්වය තුළ ඊට ගොදුරු වූවන් දේශීය බලාධිකාරිත්වයන් (Local Authorities) සමඟ දුරස්ථ වන හෙයින් එම තත්ත්වය පාලනය කිරීම සඳහා ආපදාවන්ට ගොදුරු වූවන් සහ මුදවා ගැනීමේ දේශීය බලාධිකාරිත්වය යන දෙපාර්ශ්වයන් අතර සබඳතා ඇති කිරීමට සමාජ වැඩකරුට හැකියාවක් ඇති හෙයින් එම අවස්ථාව තුළ දී සමාජ වැඩකරු සබඳතා ගොඩනැංවීමේ අතරමැදියෙකු (Mediator) බවට ද පත් වේ.

ආපදා චක්‍රයේ මෙම අවධිය තුළ සමාජ වැඩකරුගේ මැදිහත්වීම සිදු කිරීමේ දී යොදා ගත හැකි සුදුසු ක්‍රමශිල්ප (Applicable Social Work Methods) ගණනාවක් හඳුනාගත හැකි වේ. එහි දී, ප්‍රජා අධ්‍යයන (Community Studies), සංවේග සහ දුක් ගැනවිලි සම්බන්ධ ක්‍රම ශිල්ප (Condolences and Grief Work), මනෝ සමාජවැඩ (Psychatric Social Work), මානසික සහ ප්‍රජා සෞඛ්‍ය අධ්‍යාපනය (Mental and Community Health Education) සමාජ ජාලකරණය (Social Networking), ප්‍රත්‍යයක, කණ්ඩායම් සහ ප්‍රජා කටයුතු (Case, Group and Community work) වැනි ක්‍රමශිල්ප ඒ අතර වඩාත් වැදගත් වේ. මෙලෙස සමාජ වැඩකරුවන් සතු ව පවත්නා දැනුම (Knowledge), අගයන් (Values) සහ කුසලතා (Skills) ඔස්සේ ආපදා තක්සේරුකිරීම් මැදිහත්වීම් සිදු කළ හැකි හෙයින් මෙම අවධිය තුළ සමාජ වැඩකරුගේ භූමිකාවේ පවත්නා අවශ්‍යතාව අවබෝධ කර ගත හැකි වේ.

### E. නියඟයක ප්‍රතිසාධන අවස්ථාව

ආපදා චක්‍රයේ තෙවැනි අවස්ථාව වන්නේ ප්‍රතිසාධන නැතහොත් ප්‍රතිප්‍රාප්ති අවස්ථාව (Recovery Phase) යි. ආපදා තත්ත්වයන් තුළින් උද්ගත වූ නොයෙක් ආකාරයේ පීඩාකාරී අද්දැකීම් අත්විඳ පවත්නා අයහපත් පරිසර සාධක මධ්‍යයේ සාමාන්‍ය තත්ත්වයට පත් වීමට මිනිසුන් උත්සාහ කිරීම මෙම අවධියට අයත් වේ. ආපදා කළමනාකරණය සම්බන්ධ බොහෝ ප්‍රතිපත්ති හා වැඩසටහන් තුළින් පොදුවේ හඳුනාගත හැකි තත්ත්වයක් වන්නේ ආපදා කළමනාකරණ මැදිහත්වීම ආපදාවන්ට මුහුණ දෙන අවස්ථාවෙන් පසුව එළැඹෙන පශ්චාත් ආපදා තත්ත්වය පිළිබඳ ව ප්‍රමාණවත් අවධානයක් යොමු නොකර තිබීම යි.

විශේෂයෙන් ම අධ්‍යයනයට ලක් වූ ප්‍රදේශය තුළින් අනාවරණය කර ගත හැකි වූයේ නියං කාලයෙන් පසු ව ඇති වන අධික වර්ෂාපතනය නැවත මෙම ප්‍රදේශ ගංවතුරට ලක්වීමේ ඉහළ සම්භාවිතාවක් පැවතීම පශ්චාත් නියං කාලය තුළ ඔවුන් තව දුරටත් අවදානමට පත් කිරීමට හේතු වන බව යි. ඒ අනුව පැහැදිලි වන්නේ පශ්චාත් නියං අවධිය තුළ මෙම ප්‍රදේශයන්හි ජීවත්වන්නන්ට තවත් ආපදා තත්ත්වයකට මුහුණ පෑමට සිදු වීමේ ඉහළ හැකියාවක් පැවතීම පවත්නා ගැටලු තව දුරටත් සංකීර්ණ වීමට හේතු විය හැකි බව යි. මෙවැනි පසුබිමක් තුළ නියං ආපදා තත්ත්වයන්ට පෙර මිනිසුන් තුළ සූදානමක් ඇති කරනු

ලැබුවා හා සමාන ව පශ්චාත් ආපදා අවධිය තුළ මුහුණ පෑමට සිදු වන මෙම ආපදා තත්ත්වයට ද මිනිසුන් සූදානම් කිරිම සඳහා සමාජ වැඩකරුගේ මැදිහත්වීම අවශ්‍ය වේ.

මීට අමතර ව, පශ්චාත් ආපදා සමය තුළ මිනිසුන්ට පෙර පැවති තත්ත්වය උදාකර ගැනීම සඳහා හේතු වන අනුවර්තන සේවාවන් සැපයීම (Adoption Services) සමාජ වැඩකරුගේ මැදිහත්වීම යටතේ සිදු කිරීම කළ හැකි වේ. මෙම අවධිය තුළ ඊට ලක්වූවන්ගේ සෞඛ්‍යය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම මිනිසුන් තුළ අනුවර්තන හැකියාව ඇති කිරීමට ද හේතු වන බව රොබට්ගේ ACT ආකෘතියෙන් ද පෙන්වා දී ඇති කරුණකි. ආපදා කළමනාකරණ ක්‍රියාවලියේ සමාජ වැඩකරුගේ මැදිහත්වීම සාකච්ඡා කිරීමේ දී එහි ප්‍රතිකාරය (Treatment) තුළ ඔහු වැඩි නැඹුරුතාවක් දක්වා ඇත්තේ පශ්චාත් ආපදා සමය තුළ මිනිසුන්ට ඇති විය හැකි පශ්චාත් ව්‍යසන ආතති ආබාධමය (Post Traumatic Stress Disorder) තත්ත්වයන්ට වැඩි වශයෙන් අවධානය යොමු කළ යුතු බව යි (Galambos, 2005; Johnston, 2014). මේ නිසා සමාජ වැඩකරුවන් විසින් ඇති විය හැකි මෙවැනි තත්ත්වයන් හඳුනාගනු ලබමින් අවශ්‍යතා සහිත පුද්ගලයින් සෞඛ්‍ය සේවාවන් වෙත යොමු කරවීම මෙහි දී කළ හැකි වේ. තව ද ආපදාවන්ට මුහුණ දීමත් සමඟ මිනිසුන් තුළ ඇති වී තිබෙන විවිධ මානසික පසුගාමිත්වය, ඉච්ඡාභංගත්වය (Frustrations), අපේක්ෂා විරහිතභාවය (Hopelesness) හෝ වෙනත් අතෘප්තිකර තත්ත්වයන් (Dissatisfactions) වැනි නිශේධනාත්මක පැතිකඩ වෙනස් කරමින් මිනිසුන්ට ජීවිතය දෙස ප්‍රතිඅර්ථකථනයකින් (Re-Identify) බැලීමට හැකි ආකාරයේ බලගැන්වීම සිදු කළ හැකි සමාජ වැඩකරු මෙහි දී සමාජ මනෝවිද්‍යාත්මක සන්දර්භයක් තුළ අධ්‍යාපනඥයෙකුගේ (Educator) භූමිකාව මෙහෙයවයි. මීට අමතර ව අවශ්‍යතා සහිත පුද්ගලයින් හඳුනා ගනිමින් එම පවුල්වලට හා ළමයින්ට අවශ්‍ය සේවා (Family and Child Care Services), උපදේශනය (Counseling Services) ප්‍රජා පුනරුත්ථාපන සේවාවන් (Community Rehabilitation Services) සහ වැළැක්වීමේ වැඩසටහන් (Preventive Programs) සමාජ වැඩකරුගේ පුරෝගාමිත්වයෙන් සිදු කළ හැකි අතර එහි දී සමාජ කළමනාකරුවෙකු (Social Manager) ලෙස ආපදාවට ගොදුරු වූවන් බලගැන්වීම (Empowernment) සිදු කළ හැකි වේ.

Zakour (2009) පෙන්වා දෙන ආකාරයට, කිසියම් නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක් තුළ ජීවත් වන මිනිසුන්ට මුහුණ පෑමට සිදු වන ආපදා තත්ත්වයකින් පසු ව ආපදා අවස්ථාව තුළ ඔවුන්ට මුහුණ පෑමට සිදු වූ අමිහිරි අද්දැකීම් ඔවුන් තුළ වේදනාකාරී මතකයන් (Painful Memories) ලෙස ගබඩා වී ඇති බවත් එය අදාළ සමූහයකට ම බලපාන හෙයින් එය සාමූහික කම්පන (Collective Trauma) තත්ත්වයක් දක්වා වර්ධනය වේ. මේ නිසා පශ්චාත් ආපදා තත්ත්වයන් තුළ සිදු කරනු ලබන මැදිහත්වීම්වල දී ප්‍රජා දායකත්වය (Community Involvement) වර්ධනය වන ආකාරයේ වැඩසටහන් ඇති කරලීම මඟින් ආපදාවන් මඟින් ඇති කර තිබෙන බලපෑම සාමූහික ව හුවමාරු කර ගැනීමේ අවස්ථාව මිනිසුන්ට විශාල පිටිවහලක් සපයයි. විශේෂයෙන් ම ස්වයං උපකාරක කණ්ඩායම් (Self -help groups) ඇති කරලීම ඔස්සේ මිනිසුන්ට තමන් මුහුණ දෙමින් සිටින ගැටලු (Problems) සහ චිත්තවේග (Emotions) අන්‍යෝන්‍ය ආකාරයෙන් හුවමාරු කර ගැනීමට මෙන් ම සාමූහික ව ඒ සඳහා විසඳුම් යෝජනා කිරීමේ අවස්ථාව ලබා දීම වැදගත් වේ. තව ද, මිනිසුන් සාමූහික ව ඒකාබද්ධ කරලීමේ දී ඔවුන් අයත් සමාජ ආයතන (Social Institutions) එනම්, පාසල්,

රෝහල්, ආගමික ස්ථාන, රාජ්‍ය, රාජ්‍ය නොවන හෝ වෙනත් පෞද්ගලික ආයතන හා වෙනත් සේවා සපයනු ලබන ආයතන අතර සම්බන්ධතාව ඇති කරමින් වඩාත් ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ සමාජ වැඩකරුට පශ්චාත් ආපදා සමය කළමනාකරණය කිරීමේ දී වඩාත් කාර්යක්ෂම මැදිහත්වීමක් සිදු කළ හැකි වේ. එය නියං ආපදාවන්ට ලක් වූ පුද්ගල, පවුල්, සහ ප්‍රජා කණ්ඩායම්වලට නැවත ඔවුන්ගේ සාමාන්‍ය ජන ජීවිතයේ පැවති තත්ත්වය උදා කර ගැනීම සඳහා ඉවහල් වන අතර එමඟින් සමාජ වෘත්තිවේදයේ මුඛ්‍ය අරමුණ බවට පත් වූ පුද්ගල යහපැවැත්ම ඇති කිරීම හා වර්ධනය කිරීමට ද මූලාරම්භයක් වනු ඇත.

## F. නියඟයකින් පසු නැවත සංවර්ධනය වීමේ අවස්ථාව

ආපදා චක්‍රයේ අවසන් අදියර බවට පත් වන්නේ නැවත සංවර්ධනය (Re-development) වීමේ අවස්ථාව යි. සෙසු අවස්ථාවන්ට වඩා මෙය දිගුකාලීන ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිදු කළ යුතු මැදිහත්වීමක් වන නිසා ම බොහෝ අවස්ථාවන්හි මෙම අවස්ථාව මඟහැරී ගොස් ඇති බවක් ද හඳුනාගත හැකි වේ. කෙසේ නමුත් කිසියම් ජන සමූහයකට ඔවුන් මුහුණ දුන් ආපදා තත්ත්වයෙන් මිදී යළි සාමාන්‍ය තත්ත්වයට පත් වීම මෙන් ම අනාගතය තුළ එවැනි තත්ත්වයන්ගෙන් ඇති විය හැකි බලපෑම අවම කර ගැනීම සඳහා වන දිගුකාලීන සැලැස්මක් පැවතිය යුතු වේ (Dominelli, 2009). එහි දී නැවත සංවර්ධනය වීමේ අවධිය මිනිසුන්ගේ ජීවිතයේ එක් පැතිකඩක් වෙත පමණක් සීමා නොවෙමින් භෞතික පරිසරය (Physical Environment), ආර්ථික පරිසරය (Economic Environment), සමාජ පරිසරය (Social Environment), සංස්කෘතික පරිසරය (Cultural Environment), මනෝවිද්‍යාත්මක පරිසරය (Psychological Environment) හා පරිසරාත්මක (Ecological) යන සාකල්‍යවාදී ප්‍රවේශයක් (Holistic Approach) ඔස්සේ නැවත සංවර්ධනය කිරීම සඳහා වන මැදිහත්වීමේ දී සමාජ වෘත්තිවේදියාගේ මැදිහත්වීමේ අවශ්‍යතාව මොනවට පැහැදිලි වේ.

පශ්චාත් ආපදා සමය තුළ ඇති විය යුතු නැවත සංවර්ධන ක්‍රියාවලියේ දී සමාජ වැඩකරුවන්ගේ මැදිහත්වීම මූලික පැතිකඩ කිහිපයක් ඔස්සේ හඳුනාගත හැකි වේ. එහි දී සමාජ සේවා සැලසුම්කරුවෙකු (Social Services Planner) සහ ප්‍රතිපත්ති විශ්ලේෂකයෙකු (Policy Analysist) ලෙස සමාජ වැඩකරුගේ දායකත්වය මෙහි දී වඩාත් වැදගත් වේ. ඒ අනුව, කිසියම් ආපදා තත්ත්වයක් හමුවේ දැනට පවත්වා සමාජ සේවාවන් සහ ප්‍රතිපත්තිමය රාමුව කෙබඳු ස්වරූපයක් ගනු ලබන්නේ ද යන්නත්, ආපදාවලින් මිනිසුන්ට ඇති කරනු ලබන බලපෑම අවම කරලීම සඳහා ඒවා කොතෙක් දුරට ප්‍රමාණවත් වේ ද යන්න හා ඒවා ප්‍රමාණවත් නොවන්නේ නම් ඒ තුළ ඇති කළ යුතු සංශෝධන හා ඇති කළ යුතු ව තිබෙන නව තත්ත්වයන් මොනවා ද යන්න පිළිබඳ ව වඩාත් පුළුල් විශ්ලේෂණයක් සිදු කරමින් ඒවා පෙන්වා දීමේ හැකියාව සමාජ වැඩකරුවන් සතු ව පැවතිය යුතු කුසලතාවකි. එහි ප්‍රතිඵලයක් ලෙස ආපදා කළමනාකරණ ක්‍රියාවලිය තුළ ඇති කළ යුතු ප්‍රතිපත්තිමය වෙනස්කම් පිළිබඳ ව වගකිව යුතු ආයතන කෙරෙහි ඒවා යොමු කිරීමට, ඒ වෙනුවෙන් හඬක් ඇති කරමින් බලපෑම් කිරීමට මෙන් ම සමස්ත ප්‍රජාව නියෝජනය කරමින් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීම කළ හැකි වේ. උදාහරණයක් ලෙස නියඟය කිසියම් භූගෝලීය ප්‍රදේශයකට බලපෑම් කරනු ලැබුව ද, ඉන් ඇති වන බලපෑම ප්‍රාදේශීය වශයෙන් මෙන් ම එම ප්‍රදේශවල ඊට ගොදුරු වන ළමුන්, කාන්තාවන්, පුරුෂයන්, වැඩිහිටියන්, විශේෂ අවශ්‍යතා සහිත වූවන්ට ඇති කරන එකිනෙකට වෙනස් බලපෑම හඳුනා ගනිමින් ඊට සංවේදී

වන ආකාරයෙන් ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති හා වැඩසටහන් සැලසුම් කිරීමේ වැදගත්කම හා අවශ්‍යතාව පෙන්වා දීම සමාජ වැඩකරුගේ මැදිහත්වීමෙන් සිදු කළ හැකි වේ. මෙවැනි මැදිහත්වීම් ආපදාවන්ට ගොදුරු වූවන්ගේ යහපැවැත්ම දිගුකාලීන ව ස්ථාවර කරලීම සඳහා හේතු වන හෙයින් සමාජ වැඩකරුගේ මැදිහත්වීමේ අවශ්‍යතාව මොනවට පැහැදිලි වේ.

## 5. සමාලෝචනය

යථෝක්ත සාකච්ඡාවට අනුව පැහැදිලි වන්නේ ඔරොත්තු දීමට ඇති නොහැකියාව සහ සම්පත් සඳහා ප්‍රවේශ වීමට පවත්නා හැකියාව සීමිත වීමේ ප්‍රතිඵලයක් ලෙස නියං ආපදාවන් කෙරෙන් ඇති වන බලපෑම එක ම භූගෝලීය ප්‍රදේශයක් තුළ ජීවත් වන ඒ ඒ ප්‍රජා කණ්ඩායම්වලට වෙනස් ස්වරූපයන්ගෙන් බලපෑම් ඇති කරන බව යි. ඒ අනුව, නියඟයේ බලපෑමට ලක් වන අඩු ආදායම්ලාභී පවුල් තව දුරටත් පහසුවෙන් අවදානමට ලක් විය හැකි කණ්ඩායම බවට පත් වෙමින් ඔවුන්ගේ දුගීකම දිගුකාලීන ව චිරස්ථායී කරලීමට එය හේතු වී තිබේ. මේ නිසා දුගීකම පිටු දැකීමේ අරමුණින් සිදු කරනු ලබන ප්‍රාදේශීය හෝ ජාතික මට්ටමේ මැදිහත්වීම්වල දී අවධානය යොමු කළ යුතු ව තිබෙන කරුණක් වන්නේ අඩු ආදායම්ලාභී පවුල් මුහුණ දෙමින් සිටින දුගීකම ඇති කරලීම සඳහා නියඟ ඇතුළු ස්වාභාවික ආපදාවන්ගෙන් ද සැලකිය යුතු බලපෑමක් ඇති කර තිබෙන බව යි. මේ නිසා දුගීකම පිටු දැකීම හා ආපදා කළමනාකරණය යන්න හුදෙකලා ප්‍රවේශ දෙකක් ඔස්සේ තව දුරටත් ගමන් නොකරමින් මේ ද්විත්වය වඩාත් ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ සිදු කරන ක්‍රියාකාරී මැදිහත්වීම ඉතා වැදගත් වේ. එහි දී සේවා සැපයීම (Service), සමාජ සාධාරණත්වය (Social Justice), ආත්ම ගරුත්වය සහ පුද්ගල වටිනාකම (Dignity and worth of the person), මානව සබඳතාවල වැදගත්කම (Importance of Human Relationships), අඛණ්ඩතාව (Intergrity), නිපුණතාව (Competence) වැනි ප්‍රධාන මූලධර්ම මත ක්‍රියාත්මක වන උපකාරක වෘත්තියක් (Helping Profession) වූ සමාජ වැඩ මැදිහත්වීම වඩාත් සාර්ථක මෙන් ම ඵලදායී එකක් ලෙස හඳුනාගත හැකි වේ.

ඒ අනුව, සමාජයේ අවශ්‍යතා සහිත පුද්ගලයන් (Needy People) එනම්, වඩාත් පහසුවෙන් අවදානමට ලක් වීමේ හැකියාවක් සහිත (Vulnerable) මෙන් ම පීඩිත (Oppressed) පුද්ගල, පවුල් හෝ ප්‍රජා කණ්ඩායම් වෙනුවෙන් පෙනී සිටීමෙන් සමාජ සාධාරණත්වය ඇති කරලීමට අවශ්‍ය උපකාර සේවාවන් ව්‍යාප්ත කරලීම සමාජ වැඩවල ද මුඛ්‍ය අරමුණ බවට පත් වේ. මේ නිසා හදිසි ආපදා තත්ත්වයන් හේතුවෙන් ඇති වන අසමතුලිත තත්ත්වයන්හි දී ඊට මැදිහත්වෙමින් ඔවුන් සතු දැනුම සහ කුසලතා යොදවමින් පුද්ගල යහපැවැත්ම ඇති කරලීමේ සදාචාරාත්මක වගකීමක් ද සමාජ වැඩකරුවන් සතු වේ. මේ නිසා නියඟ ඇතුළු ස්වාභාවික ආපදාවන්ගෙන් සිදු විය හැකි බලපෑම අවම කර ගනිමින් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට රටක් ලෙස දරන උත්සාහය තුළ ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති හා වැඩසටහන් සැලසුම් කිරීමේ දී සමාජ වැඩ මැදිහත්වීමේ අවශ්‍යතාව මොනවට විද්‍යමාන වන්නකි.

## පරිශීලන නාමාවලිය

Alexander, David. (2012). Models of social vulnerability to disasters. *Openedition journals.* RCCS Annual review. Retrieved from; https://journals.openedition.org/rccsar/412

Alston, M., & Kent, J. (2004). Social impacts of drought. Centre for Rural Social Research. Charles Sturt University press.

Ariyabandu, M.M. (2000). Impact of Hazards on Women and Children situation in South Asia. Retrieved from; http://practicalaction.org

Ariyabandu, M.M. (1999). Defeating Disasters- Ideas for Action. Intermediate Technology Development Group (ITDG). Retrieved from; http://practicalaction.org

Ariyabandu, Madhavi Malalgoda and Maithree Wickramasinghe. (2003). Gender Dimentions in Disaster Management : A guide for South Asia. ITDG South Asia Publication.

Arku, Frank. (2010). I cannot drink water on an empty stomach: a gender perspective on living with drought. Retrieved from; http://www.jstor.org/stable/25758885

Banerjee, M.M., & Gillespie, D.F. (1994). Linking disaster preparedness and organizational response effectiveness. *Journal of Community Practice*, 3, 129–142.

Barton, A. (1969). Communities in Disaster. New York: Doubleday. Retrieved from; http://www.unisdr.org/files/596_10307.pdf

Berry, L. (1971). Human Adjustment to Agricultural Drought in Tanzania: Pilot Investigations. Natural Hazard research working paper No 19. University of Colarado. Retrieved from; http://hermes.cde.state.co.us/drupal/islandora/object/co%3A1417

Blecky, P. (1994). Risk and Natural Disasters. Rouldge: London. Retrieved from; http://www.worldbank.org/en/topic/disasterriskmanagement

Cherry, A.L., & Cherry, M.E. (1996). Research as social action in the aftermath of HurricaneAndrew. *Journal of Social Service Research*, 1, 71–87.

Dean, J., & Stain, H.J. (2010). Mental health impact for adolescents living with prolonged drought. *Australian Journal of Rural Health.* v. no 18. Australia. Retrieved from; http://www.ncbi.nlm.nih.gov/pubmed/20136812

Dodds, S., & Nuehring, E. (1996). A primer for social work research on disaster. *Journal of SocialService Research*, 1, 27–56.

Dominelli, L. (2009). Disaster interventions: immediate relief or long-term reconstruction? Introducing Social Work. London: Polity.

Enarson, Elaine. (2004). Working with Women in Disasters: Practical Lessons about Gender Equality and Disaster Risk Management. Retrieved from; https://www.gdnonline.org/resources/WorkingwithWomenEnglish.pdf

Fothergill, A. (1996). Gender, risk, and disaster. *International Journal of Mass Emergencies and Disasters*. Volume 14. Retrieved from; http://www.ijmed.org/articles/96

Fothergill, Alice, & Lori A Peek. (2004). Poverty and Disasters in the United States: A Review of Recent Sociological Findings. Department of Sociology: University of Colorado.

Fritz, C E. (1961). Disasters: Contemporary Social Problems. New York: Retrieved from; http://www.academia.edu/1767633/Gender_and_Disaster_Studies_an_overview

Galambos, C.M. (2005). Natural Disasters: Health and Mental Health Considerations. Health and Social *Work*, 30 (2), 83–86.

Gender and Disaster Network. (2005). Gender Equality in Disasters: Six Principles for Engendered Relief and Reconstruction. Retrieved from; http://online.northumbria.ac.uk/geography_research/gdn/

Goonesekere, Savitri W E. (2006). A Gender Analysis of Tsunami Impact: Relief, Recovery and Reconstruction in some districts in Sri Lanka. Centre for Women's research: Colombo.

Hanigan, Ivan. Butler, C., & Kokic, P. (2012). Suicide and drought in New South Wales, Australia, 1970-2007. Retrieved from; http://www.jstor.org/stable/41701623

International Federation of Social Workers. (2020). Difining social work. Retrived form https://www.ifsw.org/

Johnston, Wong. (2014). Social Work Interventions at different stages of disaster illustrated by Asian Experiences. Retrived from; https://www.researchgate.net/publication/281366547_Social_Work_Interventions_at_Different_Stages_of_Disaster_Illustrated_by_Asian_Experience/link/57a52f0d08ae455e853c6629/download

Lybbert, Travis. (2013). Bundling drought tolerance & index insurance to reduce rural household vulnerability to drought. Department of Agricultural & Resource Economics press.

Lynn, Kathy. (2005). Disasters and the Cycle of Poverty: understanding urban, rural, and gender aspects of social vulnerability. University of Oregon's Institute for a Sustainable Environment.

Maripe, Kgosietsiele. (2018). Social Perspective on disaster vulnerabilityamd resilience in Bostawana. *Journal of Scientific research and reports*. 18(2), 1-10.

Mary, Anderson. (1994). Understanding the disaster – development continuum: Gender Analysis is the essential tool. Retrieved from; http://www.jstor.org/stable/4030182

Parliament of the Democratic Socialist Republic of Sri Lanka. (2005). Sri Lanka Disaster Management act, no. 13 of 2005. The Department of Government printing, Sri Lanka. Retrieved from; http://www.adrc.asia/documents/dm_information/srilanka_law01.pdf

Peacock, W G., & Girard, C. (1997). Ethnic and racial inequalities in disaster damage and insurance settlements. Routledge: London.

Shultz, Irmgard. (2001). Research on Gender, the environment and sustainable development. Retrieved from; https://cordis.europa.eu/pub/eesd/docs/wp1_endversion_complete.pdf

Stehlik, D., & Lawrence, G. (1999). Drought in the 1990s: Australian farm families experiences. Report to the Rural Industries Research and Development Corporation.

Susan, Osborne. (2013). DROUGHT: Monitoring Economic, Environmental, and Social Impacts. National Climatic Data Center press.

තෙන්නකෝන්, එම් යූ ඒ. (1993). නියඟය සහ ගොවියා. ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශන.

පෙරේරා, මුදිත ප්‍රසන්නජිත්. (2000). නියඟය. ආරිය ප්‍රකාශන ; වරකපොළ.

පෙරේරා, මුදිත ප්‍රසන්නජිත්. (2010). පරිසරයේ හෙට දවස?. ආරිය ප්‍රකාශන ; වරකපොළ.